## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 පෙබරවාරි

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.02.08 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 ජනවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගිත්වය:

| | | |
|---|---|---|
| 1. | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | - ගරු සභාපති |
| 2. | ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | - ගරු උප සභාපති |
| 3. | ඩබ්.අබේසේන මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. | ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. | කේ.ඒ.අයි.ඒ.කන්දෙආරච්චි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. | යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. | එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. | එච්.අමරාවතී මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 9. | කේ.නිශාන් මැතිතුමා. | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. | පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. | අතුල ජයසිරි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. | දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 13. | පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 14. | කේ.වික්‍රම් චන්දන කස්තිරගේ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. | යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. | යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. | ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. | කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. | යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. | අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22. | වික්ටර් බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23. | එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 24. | ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 25. | පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. | එම්.වි.සුගත් මාධව මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 27. | ආර්.පි.ශ්‍රියානි ජයකොඩි මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 28. | රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 29. | එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 30. | කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 31. | බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය | -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 32. | ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 33. | එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා

කාර්යාල නිලධාරීන්:

I ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.01.11 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය:**

2022 ජනවාරි 11 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කළාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ජනවාරි 11 මහා සභා වාර්තාව සභා සම්මත විය.

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:** නැත

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :** නැත

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: -** නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.01.25 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ඇමුණුම:01**

<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව</u>

දිනය:-2022.01.25 වේලාව :- පෙ:ව:11.00

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් අනෙකුත් සමාජික ගරු මන්ත්‍රී තුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ වාර්තාවයි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | ගරු සභාපති |
| 02 | විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | ගරු උප සභාපති |
| 03 | ඩබ්.අබේසේන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04 | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05 | ලක්මාල් සමරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06 | විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07 | එම්.එම්.ෆර්හාන් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08 | සුධර්මා ලක්මාලි මැතිණිය | ගරු මන්ත්‍රී |

**කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා :**

I. බැලවාන අලුත් වලව්ව වත්ත ප්‍රදේශයට කසළ ට්‍රැක්ටරය ගෙන්වා ගැනීම සඳහා එම ප්‍රදේශයේ පදිංචිකරුවන් විසින් සිදු කරන ලද ඉල්ලීමක් කාරක සභාවේ තිරණ ලබා ගැනීම සඳහා යොමු කර තිබුණි.

**තීරණය:**
විෂය නිලධාරීගේ ස්ථාන පරීක්ෂණ වාර්තාවට අනුව එම ඉඩම වෙන්දේසි ඉඩමක් බවත් පර්චස් 10 ප්‍රමාණයේ කුඩා ඉඩම් කැබලි වල නිවාස 35 ක් පමණ පිහිටා ඇති බවත් සඳහන් කර තිබුණු බැවින් සහ එකී කුඩා ඉඩ ප්‍රමාණයේ ඔවුන්ගේ දෛනික කසළ නිසි පරිදි බැහැර කිරීමට ඉඩක් සපයා ගැනීම අපහසු බැවින් එම කරුණු පිළිබඳව සලකා බලා නාපාවල ප්‍රදේශයේ කසළ එක් රැස් කිරීමට සභාවේ ට්‍රැක්ටර් රථය යන අවස්ථාවේදී අදාල ප්‍රදේශයේ කසළ එකතු කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට සුදුසු බවට කාරක සභාව තීරණය කරන ලදී.

II. දෙහිඕවිට ප්‍රාදේශිය සභාවට අයත් ක්‍රීඩා පිටිය පිහිටි භූමියෙහි දැරණියගල මාර්ගයට ආසන්නයේ වම්පස පිහිටි සභාවට අයත් පර්චස් 80 ක භූමි ප්‍රමාණය සීතාවක පොලිස් අධිකාරී කාර්යාලය විසින් දෙහිඕවිට පොලීසිය සඳහා ස්ථිර ගොඩනැඟිල්ලක් සෑදීම වෙනුවෙන් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහන් ලිපිය කාරක සභාවේ අවධානය සඳහා යොමු කර තිබුණි.

**තීරණය:**
මෙම දේපල සභාව සතු භූමියක් වන බැවින් සහ ඉදිරි සංවර්ධන කටයුතු වලදී එය ළමා උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමේ සැලසුමක් පවතින බැවින් අදාල ඉල්ලීම සඳහා එකඟ විය නොහැකි බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

III. දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරී තනතුරේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අයි.ටී. විජේතුංග මහතාගේ දීර්ඝ කරන ලද සේවා කාලය 2022 පෙබරවාරි 28 වෙනි දිනෙන් අවසන් වීමට නියමිතව ඇති බැවින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 ට අනුව විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයට යෙදවීම යටතේ ඉදිරි මාස 06 ක කාලයක් සඳහා ඔහුගේ සේවා කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මෙම සභාවේ කාර්මික නිලධාරී තනතුරක පුරප්පාඩුවක් පවතින බැවින් මොහුගේ සේවය තවදුරටත් සභාවට අවශ්‍ය වීම මත මහා සභා අනුමැතියට යටත්ව එකී යෝජනාව සඳහා අනුමැතිය ලබා දීමට කාරක සභාව තීරණය කරන ලදී.

iv. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ZA 0126 දරණ ජේ.සී.බී.යන්ත්‍රයේ ඇන්ජිම හැර සිසු ක්‍රියාකාරී කොටස් වල ක්‍රියාකාරිත්වය නිසි පරිදි සිදු නොවන බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා ලබා ගත් ඇස්තමේන්තු අනුව රුපියල් ලක්ෂ හතකට ආසන්න මුදලක් ඒ සඳහා වැය වන බව ගණන් බලා ඇත. මෙම යන්ත්‍රය අලුත්වැඩියා නොකිරීම මත සභාව මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු වලට මෙන්ම ජේ.සී.බී.යන්ත්‍රය කුලියට ලබා දීමෙන් සභාව ලබන ආදායම අහිමි වීම තුළින්ද විශාල පාඩුවක් සිදු වන බැවින් සභා අරමුදලේ ප්‍රතිපාදන යොදවා ජේ.සී.බී.යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ඉල්ලා විෂය නිලධාරී විසින් ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අදාල කාර්ය සිදු කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

❖ මීට අමතරව දෙහිඕවිට එළු කුකුල් මස් කඩය 2022 වර්ෂයට ටෙන්ඩර් නොවීම නිසා එම ස්ථානයේ ආරක්ෂාව සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු විය යුතු බවට ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් පෙන්වා දෙන ලදී. ටෙන්ඩර් නොවූ මස් කඩය අළෙවි කටයුතු සඳහා යොදා ගැනීම වැලැක්වීමට එයට ඉඹි යතුරු දමා විසීමට හැකි ලෙස සකස් කිරීම සුදුසු බවට කාරක සභාවට සහභාගී වූ මන්ත්‍රීවරුන් පෙන්වා දුන් බැවින් සභාවේ සේවකයන් යොදවා එකී කාර්ය සිදු කිරීමට පියවර ගන්නා ලෙස විෂය නිලධාරීට උපදෙස් ලබා දිය යුතු බව පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 ජනවාරි මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී දිස්නා කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම අංක 02

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**2022 ජනවාරි මස 31 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්**

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| ජනවාරි:06 | 1 | මු.භා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 6,000.00 |
| ජනවාරි:06 | 2 | ටෙෂ්මි ඉලෙක්ට්‍රිකල්ස්<br>ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැවී ගිය බල්බ අලුතින් යෙදීම සඳහා ලබාගත් බල්බ වෙනුවෙන් මුදල් ගෙවීම. | 102,645.00 |
| ජනවාරි:06 | 3 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2021 දෙසැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 886,263.10 |
| ජනවාරි:10 | 4 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2021/11/24-2021/12/24 දක්වා බිල්පත ගෙවීම. | 547.56 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:10 | 5 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/177/18 දරණ මාගම්මන ආයුර්වේදයේ<br>2021/10/05-2021/12/04 දක්වා බිල්පත ගෙවිම. | 10,411.23 |
| ජනවාරි:10 | 6 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ<br>2021/11/05-2021/12/04 දක්වා බිල්පත ගෙවිම. | 835.20 |
| ජනවාරි:10 | 7 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දූව සතිපොල 2021/11/05-<br>2021/12/05 දක්වා බිල්පත ගෙවිම. | 19,126.65 |
| ජනවාරි:10 | 8 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ<br>2021/11/05-2021/12/04 දක්වා බිල්පත ගෙවිම. | 2,516.04 |
| ජනවාරි:10 | 9 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ<br>2021/11/01-2021/12/10 දක්වා බිල්පත ගෙවිම. | 271.80 |
| ජනවාරි:10 | 10 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා<br>කාර්යාලයේ 2021/11/06-2021/12/06 දක්වා බිල්පත ගෙවිම. | 4,821.12 |
| ජනවාරි:10 | 11 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/265/16 දරණ තල්දූව පුස්තකාලයේ<br>2021/10/03-2021/11/03 දක්වා බිල්පත ගෙවිම. | 445.99 |
| ජනවාරි:10 | 12 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6321102601 දරණ පනාවල පෙර පාසලේ 2021/10/30-<br>2021/12/30 දක්වා බිල්පත ගෙවීම. | 974.10 |
| ජනවාරි:10 | 13 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7921106404 දරණ දෙහිඕවිට මහජන පුස්තකාලයේ<br>2021/11/12 සිට 2021/12/19 දක්වා බිල්පත ගෙවීම. | 2,106.60 |
| ජනවාරි:10 | 14 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7905151905 දරණ තල්දූව සතිපොළේ 2021/11/23-<br>2021/12/24 දක්වා බිල්පත ගෙවීම. | 16,235.00 |
| ජනවාරි:10 | 15 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2021/11/28-<br>2021/12/30 දක්වා බිල්පත ගෙවීම. | 1,521.00 |
| ජනවාරි:10 | 16 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරන ඊ/ආදාහනාගාරයේ 2021/11/25-<br>2021/12/26 දක්වා බිල්පත ගෙවීම. | 2,419.95 |
| ජනවාරි:10 | 17 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2021/11/20-<br>2021/12/16 දක්වා බිල්පත ගෙවීම. | 807.30 |
| ජනවාරි:10 | 18 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:2692684915 දරණ පනාවල පුස්තකාලයේ 2021/10/30-<br>2021/12/30 දක්වා බිල්පත ගෙවීම. | 480.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:10 | 19 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ. 6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2021/11/16 සිට 2021/12/15 දක්වා බිල්පත ගෙවීම. | 294.90 |
| ජනවාරි:10 | 20 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ. 6312082709 දරණ තල්දූව පුස්තකාලයේ 2021/11/14 සිට 2021/12/16 දක්වා බිල්පත ගෙවීම. | 626.30 |
| ජනවාරි:10 | 21 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2021 දෙසැම්බර් මස මුදල ගෙවීම. | 63,500.00 |
| ජනවාරි:10 | 22 | එකමුතු ගොවි සංවිධානය-එළවුල්ල<br>එළවුල්ල මීනුවන්දෙණිය මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රඳවුම් ගෙවීම. | 49,500.00 |
| ජනවාරි:10 | 23 | සහන වැඩිහිටි සමිතිය-පහල තල්දූව<br>තල්දූව දුම්රිය හරස්පාර රාණි මියගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රඳවුම් මුදල් ගෙවීම. | 20,000.00 |
| ජනවාරි:11 | 24 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජනවාරි මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 787,000.00 |
| ජනවාරි:11 | 25 | මු.හා.ක-එච්.ගයාන් දේශප්‍රිය<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 11,420.00 |
| ජනවාරි:11 | 26 | මු.හා.ක-ලේකම්<br>තැපැල් මුද්රා යන්ත්‍රයට මුද්දර සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| ජනවාරි:11 | 27 | මු.හා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>2021/12/11-2022/01/10 දක්වා දෙ/ප්‍රා/සභාවේ ලේකම් ධූරයේ වැඩ බැලීමේ දීමනාව ගෙවීම. | 10,583.75 |
| ජනවාරි:11 | 28 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2021.11.09 හා 2021.12.14 දින පැවති මහා සභා රැස්වීම් වල සංග්‍රහ වියදම් ගෙවීම. | 8,820.00 |
| ජනවාරි:11 | 29 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>ශබ්ද විකාශන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,100.00 |
| ජනවාරි:11 | 30 | මු.හා.ක-එච්.එම්.එම්.ආර්.වීරසූරිය<br>ශ්‍රී සුමන සමන්දේව ප්‍රතිමාව රැගෙන යන පෙරහැර වෙනුවෙන් සැකසූ බැනරය සඳහා අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 1,380.00 |
| ජනවාරි:13 | 31 | රත්න මෝටර්ස්<br>QU2004 ත්‍රීවිල් රථය සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2021 නොවැම්බර්) | 22,820.00 |
| ජනවාරි:13 | 32 | යූනික් මෝටර්ස්<br>LL7582 කැබ් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2021 දෙසැම්බර්) | 38,285.00 |
| ජනවාරි:13 | 33 | ඊ.කේ.ඩී.සමන් ඒකනායක<br>කම්බි අඩිය පාලම යට සිරවී තිබූ කොට්ට ගස කපා ඉවත් කිරීම සඳහා කුලිය ලබා දීම. | 4,900.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:13 | 34 | ජාතික රක්ෂණ භාර අරමුදල<br>මාර්ගස්ත මුදල් රක්ෂණය වෙනුවෙන් 2022 වාර්ෂික මුදල් ගෙවීම. | 17,187.90 |
| ජනවාරි:13 | 35 | ජාතික රක්ෂණ භාර අරමුදල<br>RA7673 දරණ ට්‍රැක්ටරය සඳහා රක්ෂණ වාරිකය අලුත්කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,187.12 |
| ජනවාරි:13 | 36 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,080.00 |
| ජනවාරි:13 | 37 | ලේකම්-එළදායිතා ලේකම් කාර්යාලය<br>ජාතික එලදායිතා ලේකම් කර්යාලය මගින් පැවැත්වූ එලදායිතා පුහුණුව සඳහා සහභාගී වූ නිලධාරීන් වෙනුවෙන් ආයෝජන මුදල් ගෙවීම. | 12,000.00 |
| ජනවාරි:13 | 38 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 5,100.00 |
| ජනවාරි:18 | 39 | ඔෆිස් ට්‍රොනික්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඇඟිලි සළකුණු යන්ත්‍රය වාර්ෂිකව සේවා කිරීමේ ගාස්තු ගෙවීම.(2021.12.10-2022.12.09) | 17,500.00 |
| ජනවාරි:18 | 40 | එල්.එම්.කේ.ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානය සඳහා මැසි නාශක ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,500.00 |
| ජනවාරි:18 | 41 | සී.එම්.පී.රුවන් කුමාර<br>ලිපි ද්‍රව්‍ය හා කසල කවර ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,840.00 |
| ජනවාරි:18 | 42 | මු.භා.ක-ඩබ්.පී.එස්.පී.විජයන්ති<br>සැලසුම් කමිටු ගමන් වියදම් ගෙවීම. | 2,680.00 |
| ජනවාරි:18 | 43 | මු.භා.ක-ඩබ්.පී.එස්.පී.විජයන්ති<br>සැලසුම් කමිටු දීමනා ගෙවීම. | 750.00 |
| ජනවාරි:18 | 44 | බී.එම්.සී.පී.බාලසූරිය<br>සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සඳහා ලබාගත් බූට් 30 ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 84,000.00 |
| ජනවාරි:18 | 45 | බෙස්ට් වේ කම්පියුටර්ස්<br>ආදායම් අංශයේ තිලිණි මියගේ පරිගණක යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,800.00 |
| ජනවාරි:18 | 46 | බෙස්ට් වේ කම්පියුටර්ස්<br>දෙ/ප්‍රා/සභා කාර්යාල සංකීර්ණයේ CCTV කැමරා පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 169,950.00 |
| ජනවාරි:19 | 47 | මු.භා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2021.12.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 430.00 |
| ජනවාරි:19 | 48 | මු.භා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>සංග්රහ වියදම් ගෙවීම. | 980.00 |
| ජනවාරි:19 | 49 | මු.භා.ක-එච්.එස්.ජී.දිනාලංකාර<br>ගමන් වියදම් ගෙවීම. | 616.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:19 | 50 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න<br>2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,000.00 |
| ජනවාරි:19 | 51 | මු.හා.ක-බී.ඩී.ටී.ටී. ප්‍රේමරත්න<br>2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 4,900.00 |
| ජනවාරි:19 | 52 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි<br>2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| ජනවාරි:19 | 53 | මු.හා.ක-ආර්.එච්.එම්.එන්.පත්මසිරි<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 1,597.00 |
| ජනවාරි:19 | 54 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2021/12/04-2021/01/03 දක්වා බිල්පත ගෙවිම. | 4,445.28 |
| ජනවාරි:19 | 55 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2021/12/04-2022/01/04 දක්වා බිල්පත ගෙවිම. | 849.60 |
| ජනවාරි:19 | 56 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2021/12/10-2022/01/09 දක්වා බිල්පත ගෙවිම. | 291.60 |
| ජනවාරි:19 | 57 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/01/067/174/14 දරණ ඊ/ ආදාහනාගාරයේ 2021/10/22-2021/12/22 දක්වා බිල්පත ගෙවිම. | 2,169.90 |
| ජනවාරි:19 | 58 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2021/12/06-2022/01/06 දක්වා බිල්පත ගෙවිම. | 5,470.56 |
| ජනවාරි:19 | 59 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/177/18 දරණ දෙ/පොදු වැසිකිළියේ 2021/12/04-2022/01/03 දක්වා බිල්පත ගෙවිම. | 4,857.20 |
| ජනවාරි:19 | 60 | එච්.පී.ජයසිංහ<br>2021 ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ලබාගත් නෙස්කැෆේ පිටි පැකට් වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| ජනවාරි:19 | 61 | එච්.පී.ජයසිංහ<br>ශ්‍රම අභිමන් වැඩසටහන සඳහා ලබාගත් නෙස්කැෆේ පිටි පැකට් වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,600.00 |
| ජනවාරි:19 | 62 | එච්.පී.ජයසිංහ<br>නෙස්කැෆේ පිටි පැකට් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,800.00 |
| ජනවාරි:19 | 63 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>ප්‍රා/සභා ගබඩා කාමරය සඳහා අලුතින් බල්බ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| ජනවාරි:19 | 64 | සකුරා හාඩ්වෙයාර්<br>පනාවල පෙර පාසලේ තීන්ත ආලේප කිරීම සඳහා ලබාගත් තීන්ත වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,780.00 |
| ජනවාරි:19 | 65 | සකුරා හාඩ්වෙයාර්<br>දිගලවත්ත කසල ව්‍යාපෘතියේ අවශ්‍යතාවය සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,225.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:19 | 66 | ඩී.සී.කලුආරච්චි<br>2022 ජනවාරි 01 දින පැවති ආගමික උත්සවය සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,625.00 |
| ජනවාරි:19 | 67 | දෙහිඕවිට පික්චර් පැලස්<br>කාර්යාලයේ දොරවල් සඳහා ලබාගත් දොර ලොක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,600.00 |
| ජනවාරි:19 | 68 | එච්.වී.එස්.එස්.සමරතුංග<br>කහනාවිට ඇල්ල සංවර්ධනය සඳහා ඉඩම් මැන පිඹුරු සැකසීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 32,500.00 |
| ජනවාරි:19 | 69 | නිහේන් හාඩ්වෙයාර්<br>ඊ/ආදාහනාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා ලබාගත් තීන්ත වෙනුවෙන් මුදල් ගෙවීම. | 150,300.00 |
| ජනවාරි:20 | 70 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඊ/ආදාහනාගාරයේ දූරකථනයේ 2021.11.16 - 2021.12.15 දක්වා දූරකථන බිලපත ගෙවීම.( දූ.අ. 036-3868934) | 489.19 |
| ජනවාරි:20 | 71 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දූ:අ:-036-2262315 දරණ කාර්යාලීය දූරකථනයේ 2021/11/16-2021/12/15 දක්වා බිල්පත ගෙවීම. | 2,054.08 |
| ජනවාරි:20 | 72 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දූ:අ:-036-2222575 දරණ කාර්යාලීය දූරකථනයේ 2021/12/01-2021/12/31 දක්වා බිල්පත ගෙවීම. | 9,407.51 |
| ජනවාරි:20 | 73 | ශ්රී ලංකා ටෙලිකොම්<br>දූ. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දූරකතනයේ 2021.12.01-2021.12.31 දක්වා බිල්පත ගෙවීම. | 7,705.96 |
| ජනවාරි:20 | 74 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි. අ. 94363123537 දරණ WIFI රවුටරයේ 2021 දෙසැම්බර් මස බිල්පත ගෙවීම. | 815.51 |
| ජනවාරි:20 | 75 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි. අ. 94363123538 දරණ WIFI රවුටරයේ 2021 දෙසැම්බර් මස බිල්පත ගෙවීම. | 815.51 |
| ජනවාරි:20 | 76 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි. අ. 94363123539 දරණ WIFI රවුටරයේ 2021 දෙසැම්බර් මස බිල්පත ගෙවීම. | 815.51 |
| ජනවාරි:20 | 77 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි. අ. 94363123540 දරණ WIFI රවුටරයේ 2021 දෙසැම්බර් මස බිල්පත ගෙවීම. | 815.51 |
| ජනවාරි:20 | 78 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>තණකොළ කපන මැෂිම සඳහා තල 02ක් ලබා ගැනීම  වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,160.00 |
| ජනවාරි:20 | 79 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>විදුලි ජනක යන්ත්‍රය සඳහා 2021 දෙසැම්බර් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 22,540.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:20 | 80 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,440.00 |
| ජනවාරි:20 | 81 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස තණකොළ කපන මැෂිම සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,820.00 |
| ජනවාරි:20 | 82 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස ZA0126 දරණ JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 102,850.00 |
| ජනවාරි:20 | 83 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස බොබ්කැට් යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 11,600.00 |
| ජනවාරි:20 | 84 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස 250-4053 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 34,065.00 |
| ජනවාරි:20 | 85 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස 42-7498 දරණ ගිලන් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,515.00 |
| ජනවාරි:20 | 86 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස ගල්රෝල සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,600.00 |
| ජනවාරි:20 | 87 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස 252-3916 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,250.00 |
| ජනවාරි:20 | 88 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RD-8018 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 23,000.00 |
| ජනවාරි:20 | 89 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස QU2004 ත්‍රීවිලරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 14,188.50 |
| ජනවාරි:20 | 90 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස LL-7582 දරණ කෘ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 40,350.00 |
| ජනවාරි:20 | 91 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RC-1403 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 23,000.00 |
| ජනවාරි:20 | 92 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RD-6441 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,880.00 |
| ජනවාරි:20 | 93 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RE-2258 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 31,480.00 |
| ජනවාරි:20 | 94 | එම්.චන්ද්‍රා වීරසිංහ<br>දෙ/අංක 01 මාළු කඩය 2021 වර්ෂය සඳහා බදු ගැනීමට ගෙවා ඇති ටෙන්ඩර් හා ගිවිසුම් ඇප මුදල් ආපසු ගෙවීම. | 33,027.25 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:20 | 95 | එම්. චන්ද්‍රා වීරසිංහ<br>දෙ/අංක 02 මාළු කඩය 2021 වර්ෂය සඳහා බදු ගැනීමට ගෙවා ඇති ටෙන්ඩර් ඇප මුදල් ආපසු ගෙවීම. | 5,000.00 |
| ජනවාරි:20 | 96 | මු.හා.ක-ජේ.ජී.ජයවර්ධන<br>ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ධූරයේ වැඩ බැලීමේ දීමනාව ගෙවීම.(21/11/19-22/01/18 දක්වා) | 30,000.00 |
| ජනවාරි:20 | 97 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>සුළු මුදල් අග්‍රිමය අලුත් කිරීම වෙනුවෙන් ගෙවීම. | 1,000.00 |
| ජනවාරි:20 | 98 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>බේල් මැෂින් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට හයිඩොලින් 100L ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 70,000.00 |
| ජනවාරි:21 | 99 | බෝමළුව රාජසිංහ වැඩිහිටි සංවිධානය<br>වෙලන්ගල්ල මාර්ගයේ තුන්වන පටුමඟ දැනට කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 90,000.00 |
| ජනවාරි:24 | 100 | සුළුගොවි සංවිධානය-හිගුරලකන්ද නැගෙනහිර<br>හිඟුරලකන්ද දං කොම්බුව මහගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 30% මුදල් ගෙවීම. | 148,500.00 |
| ජනවාරි:24 | 101 | ඒ.කේ.නාලනී<br>රත්නගම වාසනා පෙර පාසලේ පාලිකාව සඳහා 2021 ඔක්තොම්බර්,නොවැම්බර් හා දෙසැම්බර් යන මාස සඳහා දීමනා ලබා දීම. | 6,000.00 |
| ජනවාරි:24 | 102 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2021 දෙසැම්බර් මස දෙහිඕවිට මහජන පුස්තකාලයට පුවත්පත් මිලදී ගැනීම සඳහා ගෙවීම. | 7,780.00 |
| ජනවාරි:24 | 103 | බී.ජී.තිලංග බුද්ධික මුදලිගේ<br>2021 දෙසැම්බර් මස ඉඹුල්පිටිය මහජන පුස්තකාලය ලබාගත් පුවත්පත් සඳහා ගෙවීම. | 3,950.00 |
| ජනවාරි:24 | 104 | කේ.ඒ.පී.කුරුප්පු<br>2021 වර්ෂයේ දෙසැම්බර් මස පනාවල මහජන පුස්තකාලයට පුවත්පත් මිලදී ගැනීම. | 4,930.00 |
| ජනවාරි:24 | 105 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2021 වර්ෂයේ දෙසැම්බර් මස තල්දූව මහජන පුස්තකාලයට පුවත්පත් මිලදී ගැනීම. | 4,010.00 |
| ජනවාරි:24 | 106 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2021 වර්ෂයේ දෙසැම්බර් මසයේදී මාගම්මන මහජන පුස්තකාලයට සපයන ලද දිනමින, සිළුමිණ,තරුණි, දිනපතා ලංකාදීප ඉරිදා ලංකාදීප,සිරිකත,විජය,පුවත් පත් සඳහා ගෙවීම. | 2,830.00 |
| ජනවාරි:24 | 107 | ඉඹුල්පිටිය ග්‍රාම සංවර්ධන සමිතිය<br>ඉඹුල්පිටිය අරබේකන්ද හෝනගල මාර්ගයට පිවිසෙන ස්ථානය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම. | 180,000.00 |
| ජනවාරි:24 | 108 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරන දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2021/12/01-2022/01/01 දක්වා බිල්පත ගෙවීම. | 74,799.20 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:24 | 109 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 6316208308 දරන දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2021/12/12-2021/01/11 දක්වා බිල්පත ගෙවීම. | 1,850.40 |
| ජනවාරි:24 | 110 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2021/12/16-2022/01/15 දක්වා බිල්පත ගෙවීම. | 679.26 |
| ජනවාරි:24 | 111 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7921106404 දරණ දෙ/මහජන පුස්තකාලයේ 2021/12/09-2022/01/09 දක්වා බිල්පත ගෙවීම. | 2,637.30 |
| ජනවාරි:24 | 112 | රෝහිත කුෂන්<br>LL7582 කැබ් රථයේ සීට් කවර මසා සවිකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,500.00 |
| ජනවාරි:24 | 113 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>පරිසර බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය සඳහා 2021 දෙසැම්බර් මස අධීක්ෂන හා ලිපි කටයුතු දීමනා ගෙවීම. | 750.00 |
| ජනවාරි:24 | 114 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2021.12.31 හා 2022.01.12 යන දිනයන්හි පැවති තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දීමනා ගෙවීම. | 4,000.00 |
| ජනවාරි:24 | 115 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජනවාරි මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,025,577.64 |
| ජනවාරි:24 | 116 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>නාපාවල පල්ලිය පාරේ එම්.නියාස් මයාගේ නිවස දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 89,585.28 |
| ජනවාරි:25 | 117 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි වැටුප් ගෙවීම. | 9,572.00 |
| ජනවාරි:25 | 118 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>2021 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,000.00 |
| ජනවාරි:25 | 119 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>2021 ඔක්තොම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,000.00 |
| ජනවාරි:25 | 120 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>2021 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 1,000.00 |
| ජනවාරි:25 | 121 | මු.හා.ක-එම්.එල්.අරුණ කුමාර<br>2021 ඔක්තොම්බර් මස අතිකාල ගෙවීම. | 4,951.00 |
| ජනවාරි:25 | 122 | එල්.එම්.ඩී.දමයන්ති විජේසිංහ<br>ශ්‍රම අභිමන් උළෙලේ සංග්‍රහ කටයුතු සඳහා ආහාර පාර්සල් 250ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 37,500.00 |
| ජනවාරි:25 | 123 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>පනාවල පෙර පාසලේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම කර්මාන්තයේ 10% මුදල් ගෙවීම. | 34,225.52 |
| ජනවාරි:25 | 124 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>පනාවල පෙර පාසලේ බිම සහ කයිරුව,පේමන්ට් එක හා පදික කොටස් පින්තාරු කිරීම කර්මාන්තයේ 10% මුදල් ගෙවීම. | 13,670.95 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:25 | 125 | ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය<br>ප්‍රා/සභා ගොඩනැගිල්ලේ ඉහළ මහලේ වැහිපීලි දැමීම,කැඩීගිය ෆ්ලැෂින් ගලවා නැවත සවිකිරීම හා අනෙකුත් අලුත්වැඩියා සඳහා කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම. | 18,698.65 |
| ජනවාරි:25 | 126 | ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය<br>මාගම්මන ආයුර්වේද ගොඩනැගිල්ල පාටිෂන් කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම. | 31,599.36 |
| ජනවාරි:25 | 127 | මෙත් සහන වැඩිහිටි සංවිධානය-ඇපලපිටිය<br>රංහවඩිකන්ද මාර්ගයේ දිලීප් මයාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 90,000.00 |
| ජනවාරි:25 | 128 | සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය<br>ඉහළවල කුරහන්වත්ත නිමල් මයාගේ නිවස අසල ඉදිකර ඇති පැති බැම්ම සඳහා කොන්ක්‍රීට් තට්ටු යෙදීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම. | 21,352.80 |
| ජනවාරි:25 | 129 | පී.ජී.ඒ.එම්.පෙරේරා<br>LL7582 කැබ් රථයට තත්ව වාර්තා ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2021 දෙසැම්බර්) | 1,000.00 |
| ජනවාරි:25 | 130 | දාස මෝටර්ස්<br>250-4053 දරන කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,850.00 |
| ජනවාරි:25 | 131 | වී.බී.සී.ධර්මසේන<br>2021.12.17 දින පැවති සැලසුම් කමිටු දීමනා ගෙවීම. | 750.00 |
| ජනවාරි:25 | 132 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>ලිපි තැපැල් කිරීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 5,000.00 |
| ජනවාරි:27 | 133 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම 2021 වර්ෂයට බදු ගැනීම සඳහා ගෙවා ඇති ටෙන්ඩර් ඇප මුදල් ආපසු ගෙවීම. | 5,000.00 |
| ජනවාරි:27 | 134 | සුමිත්‍රා දමයන්ති<br>L/29286 දරන නඩුව වෙනුවෙන් පෙනී සිටීමේ ගාස්තු ගෙවීම. | 3,000.00 |
| ජනවාරි:27 | 135 | චම්පා සී චන්ද්‍රාදාස<br>L/25768 දරන නඩුව වෙනුවෙන් පෙනී සිටීමේ ගාස්තු ගෙවීම. | 25,000.00 |
| ජනවාරි:27 | 136 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>RD8018 දරන ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 ජනවාරි) | 20,390.00 |
| ජනවාරි:27 | 137 | එස්.ඒ.එස්.ටී.පෙරේරා<br>2022.01.11 දින පැවැත් වූ ඩෙංගු වැඩසටහන වෙනුවෙන් සංග්‍රහ වියදම් ගෙවීම. | 2,750.00 |
| ජනවාරි:27 | 138 | ජේ.ඒ.ඩබ්.ඩබ්.ජයසිංහ<br>තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දීමනා ගෙවීම.(2021.12.31 හා 2022.01.12) | 1,000.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:27 | 139 | බී.ඒ.ඊ.උදයසිරි<br>තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු දීමනා ගෙවීම.(2021.12.31 හා 2022.01.12) | 1,000.00 |
| ජනවාරි:27 | 140 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2262315 දරණ කාර්යාලීය දුරකථනයේ 2021/12/16-2022/01/15 දක්වා බිල්පත ගෙවීම. | 2,039.87 |
| ජනවාරි:27 | 141 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඊ/ආදාහනාගාරයේ දුරකථනයේ 2021.12.16 - 2022.01.15 දක්වා දුරකථන බිලපත ගෙවීම.( දු.අ. 036-3868934) | 489.19 |
| ජනවාරි:27 | 142 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7905151905 දරන තල්දුව සතිපොළේ 2021/12/24-2022/01/21 දක්වා බිල්පත ගෙවීම. | 240.00 |
| ජනවාරි:27 | 143 | මොබිටෙල් පුද්ගලික සමාගම<br>ගි:අං: 18180420 දරණ පෙරටු කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෙටි පණිවුඩ සේවාවේ 2021/11/25-2021/12/24 දක්වා බිල්පත ගෙවීම. | 174.38 |
| ජනවාරි:27 | 144 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ. 6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2021/12/15 සිට 2022/01/14 දක්වා බිල්පත ගෙවීම. | 313.20 |
| ජනවාරි:27 | 145 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2021/12/16-2022/01/19 දක්වා බිල්පත ගෙවීම. | 898.80 |
| ජනවාරි:27 | 146 | මු.හා.ක-එම්.ජී.ජනක රත්නායක<br>බේල් යන්ත්‍රයට හයිඩ්‍රෝලික් තෙල් ලබා ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 3,900.00 |
| ජනවාරි:27 | 147 | මු.හා.ක-එම්.ජී.ජනක රත්නායක<br>දිගලවත්ත බුදු කුටියේ තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 730.00 |
| ජනවාරි:27 | 148 | මු.හා.ක-එම්.ජී.ජනක රත්නායක<br>බේල් යන්ත්‍රයට ගැස්කට් 1 ක් ලබා ගැනීම වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 550.00 |
| ජනවාරි:27 | 149 | මු.හා.ක-එම්.සී.ආර්.විජේරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජනවාරි:27 | 150 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජනවාරි:27 | 151 | මු.හා.ක-එම්.ජී.එන්.කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජනවාරි:27 | 152 | මු.හා.ක-එම්.ජී.ජේ.රත්නායක<br>ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ජනවාරි:27 | 153 | මු.හා.ක-ආර්.ඩී.නලීන් පුෂ්පකුමාර<br>නිවාඩු දින සේවයෙහි වැටුප් ගෙවීම. | 13,501.25 |
| ජනවාරි:27 | 154 | ආර්.ආර්.කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්<br>ආදාහනාගාරයේ දහන කුටිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත් ගෙවීම. | 455,760.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:27 | 155 | ඒ.ජී.මෙල්කෝ ඉලවේටර් කම්පැණි ලංකා ප්‍රයිවට් ලිමිටඩ්<br>ප්‍රා/සභා කාර්යාලයේ විදුලි සෝපානය සේවා කිරීමේ වාර්ෂික සේවා ගාස්තු ගෙවීම. | 242,600.00 |
| ජනවාරි:27 | 156 | නිල්කමල් ඊශ්වරන් මාර්කටින් ප්‍රයිවට් ලිමිටඩ්<br>කාර්යාලීය මේස ලබා ගැනීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම. | 75,000.00 |
| ජනවාරි:27 | 157 | මෙට්රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ්<br>2520 ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 78,911.86 |
| ජනවාරි:27 | 158 | ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>දෙ/ප්‍රා සභාවේ ප්‍රසම්පාදන දැන්වීම පුවත්පත් වල පල කිරීමට අදාලව මුදල් ගෙවීම. | 82,413.45 |
| ජනවාරි:27 | 159 | ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>දෙ/ප්‍රා සභාවේ 2022 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල පුවත්පත් දැන්වීම් පල කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 94,554.00 |
| ජනවාරි:28 | 160 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>මානියම්ගම නාහෙල්ම මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | 852,614.91 |
| ජනවාරි:28 | 161 | ඒ.අයි.එෆ්.රුස්නියා<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පලුදු කිරීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ලබා දීම. | 10,500.00 |
| ජනවාරි:31 | 162 | එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය - ගුරුගල්ල<br>මාගම්මන ආයුර්වේද ගොඩනැගිල්ල පාටිෂන් කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම. | 15,000.00 |
| ජනවාරි:31 | 163 | අටුළුගම දකුණ නව ගොවි සංවිධානය<br>අටුළුගම දකුණ සේන මයාගේ නිවසට යන පාරේ මුල් කොටස සංවර්ධනය කිරීම 10% ගෙවීම. | 14,000.00 |
| ජනවාරි:31 | 164 | එස්.ඒ.එස්.ටී.පෙරේරා<br>2022.01.13 දින පැවැත් වූ ඩෙංගු වැඩසටහන වෙනුවෙන් සංග්‍රහ වියදම් ගෙවීම. | 1,650.00 |
| ජනවාරි:31 | 165 | රෙජිස්ට්‍රා ජනරාල්<br>2020 අගෝස්තු හා සැප්තැම්බර් යන මාසයන්ට අදාල මුද්දර ගාස්තු උපලේඛන සැකසීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 26,000.00 |
| ජනවාරි:31 | 166 | ප්‍රේමරත්න ස්ටෝර්ස්<br>දිගලවත්ත කසල ව්‍යාපෘතියේ කසල බණ්ඩල් කිරීම සඳහා කම්බි ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 69,305.00 |
| ජනවාරි:31 | 167 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස PF-7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 57,000.00 |
| ජනවාරි:31 | 168 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 දෙසැම්බර් මස RD-9461 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 27,895.00 |
| ජනවාරි:31 | 169 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2021 නොවැම්බර් මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 31,080.00 |

| | | | |
|---|---|---|---|
| ජනවාරි:31 | 170 | දේශානි ස්ටුඩියෝ<br>ශ්‍රම අභිමන් ප්‍රණාම උළෙල සඳහා ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,750.00 |
| ජනවාරි:31 | 171 | දේශානි ස්ටුඩියෝ<br>ශ්‍රම අභිමන් ප්‍රණාම උළෙල සඳහා උපහාර පිදීමට මුද්‍රණය කල ඵලක වෙනුවෙන් මුදල් ගෙවීම. | 55,360.00 |
| ජනවාරි:31 | 172 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 5,470.00 |
| ජනවාරි:31 | 173 | මු.හා.ක-කේ.ජී.කේ.තිලකරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 4,020.00 |
| ජනවාරි:31 | 174 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර<br>ප්‍රා/සභා විසිතුරු මාළු ටැංකියේ නඩත්තු කටයුතු සඳහා අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 1,950.00 |
| ජනවාරි:31 | 175 | මු.හා.ක-එම්.එල්.ටී.එන්.මුනසිංහ<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 2,492.00 |
| ජනවාරි:31 | 176 | මු.හා.ක-එම්.ජී.ජනක රත්නායක<br>දිගලවත්ත බුදු පිළිමය තැන්පත් කිරීම සඳහා පහන් කණුවක් ලබා ගැනීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 4,900.00 |
| ජනවාරි:31 | 177 | මු.හා.ක-එම්.ජී.ජනක රත්නායක<br>දිගලවත්ත අප ජලය බැස යන කාණුවේ අලුත්වැඩියාව සඳහා ලබාගත් සිමෙන්ති කොට්ටයක් වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 1,375.00 |
| ජනවාරි:31 | 178 | මු.හා.ක-ආර්.ඩබ්.එම්.ඊ.කේ.චන්ද්‍රවීර<br>නාපාවල පැවැත් වූ ඩෙංගු මර්ධන වැඩසටහන වෙනුවෙන් සංග්‍රහ වියදම් ගෙවීම. | 800.00 |
| ජනවාරි:31 | 179 | මු.හා.ක-ආර්.ඩබ්.එම්.ඊ.කේ.චන්ද්‍රවීර<br>කාර්යාලීය කටයුතු සඳහා වර්ණ ඡායා පිටපත් ලබා ගැනීමට අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 320.00 |
| ජනවාරි:31 | 180 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>2022.01.25 දින පැවැත්වූ පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 910.00 |
| ජනවාරි:31 | 181 | මු.හා.ක-ඒ.එන්.ඩී.එම්.අකුරගොඩ<br>නිවාස හා ප්‍රජා කාරක සභාවේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 910.00 |
| | | | **9,510,221.55** |
| ජනවාරි:07 | 1 | සේවක ණය<br>විශේෂ අත්තිකාරම් ලබා දීම. | 72,000.00 |
| ජනවාරි:11 | 2 | සේවක ණය<br>විශේෂ අත්තිකාරම් ලබා දීම. | 36,000.00 |
| ජනවාරි:19 | 3 | සේවක ණය<br>විශේෂ අත්තිකාරම් ලබා දීම. | 12,000.00 |
| | | **එකතුව** | **9,630,221.55** |

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමටත් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරී තනතුරේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අයි.ටී. විජේතුංග මහතාගේ දීර්ඝ කරන ලද සේවා කාලය 2022 පෙබරවාරි 28 වෙනි දිනෙන් අවසන් වීමට නියමිතව ඇත. දැනට මෙම සභාවේ කාර්මික නිලධාරී තනතුරක පුරප්පාඩුවක් පවතින බැවින් මොහුගේ සේවය තවදුරටත් සභාවට අවශ්‍ය වීම මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 ට අනුව විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයට යෙදවීම යටතේ ඉදිරි මාස 06 ක කාලයක් සඳහා ඔහුගේ සේවා කාලය දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම ලබා දී තිබූ කාලය 2022.01.31 දිනෙන් අවසන් වීමට නියමිත වුවත් ප්‍රමාණවත් අයදුම්පත් නොලැබී තිබීම හේතුවෙන් එම කාල සීමාව 2022.02.20 වන දින දක්වා දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල නළ එලීම සඳහා මාර්ගය පළුදු කිරීම් සිදු කළ පසු නැවත යථා තත්වයට පත් කිරීම විධිමත් පරිදි සිදු නොවන බවට නිරන්තරයෙන් පැමිණිලි ඉදිරිපත් වෙයි. එබැවින් 2022 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල නළ එලීම සඳහා මාර්ගය පළුදු කිරීම් සිදු කරන අවස්ථා වලදී පහත සඳහන් කොන්දේසි වලට යටත්ව එකී කාර්ය සිදු කිරීම සඳහා අදාල පාර්ශව සමඟ එකඟතායකට පත් වීම සුදුසු බව යෝජනා කරමි.

- ජල සම්පාදන මණ්ඩලය මඟින් මාර්ග පළුදු කිරීමේදී:

  ජල දිගුව ලබා දීමේදී මාර්ගය පළුදු කිරිමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවක් සකස් කර එම මුදල් සභාවේ තැන්පත් කළ යුතුය.

- ප්‍රජා ජල සමිති මඟින් මාර්ග පළුදු කිරීමේදී:

නිවාස සඳහා ජල සැපයුම් ලබා දීමේදී සභාවේ නිසි අවසරය ලබා ගත යුතු අතර, සභාවේ අනුමැතියකින් තොරව කිසිදු මාර්ගයක් පළුදු කිරීම සිදු නොකළ යුතුය.

- මීට අමතරව ජල සම්බන්ධතා ලබා දීම සඳහා මාර්ගය පළුදු කිරීම සඳහා අවසර ලබා ගැනීමට ඉදිරිපත් කරන ඉල්ලීම් ලිපිය අනුමත කිරීමේදී මාර්ගය පළුදු කර ජල නළ එලූ පසු දින හතක් (07) ක් ඇතුලත එම මාර්ගය යථා තත්වයට පත් නොකළහොත් තැන්පතුව අවලංගු කර එම මුදල් මගින් සභාව විසින් එම කාර්ය සිදු කරන බව අදාල පාර්ශවයට දැන්වීම.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන කස්තිරගේ මැතිතුමා:**

මෙම කාර්යයේදී කොන්ත්‍රාත්කරුවන් මාර්ග පළුදු වූ ස්ථාන සකස් කරන බවට පවසා තැන්පතු මුදල නිදහස් කර දෙන ලෙස ඉල්ලීම් සිදු කළ සැනෙන් එම මුදල නිදහස් කිරීම සභාව මගින් සිදු වන බවත් එලෙස මුදල් නිදහස් කරගත් පසු ඒ කාර්ය ඔවුන් විසින් නිසි පරිදි සිදු නොකරන බවත් පෙන්වා දෙන ලදී. 2021.09.14 දින මහා සභාවේදී මේ මිල ගණන් නියම කර ඇති බවත් ඒ අනුව නිවසක් සඳහා ජලය ලබා ගැනීමේදී රු. 12,000.00 ක තැන්පතුවක් සභාවේ තැන්පත් කළ යුතු බවත් සමෘද්ධි ආධාර මගින් ජීවත් වන අඩු ආදායම්ලාභී පුද්ගලයන්ට මෙවැනි මුදලක් තැන්පතු සඳහා තැබීම අසීරු කාර්යක් බවත් පෙන්වා දෙන ලදී. එම නිසා අඩු ආදායම්ලාභී පවුල් සහ සමෘද්ධි ආධාර ලබා ගන්නා පවුල් සඳහා මේ සම්බන්ධයෙන් යම් සහනයක් ලබා දීමට කටයුතු කරමුයැයි පවසා සිටින ලදී. එසේම මේ කාර්ය දින 07 ක් ඇතුලත සකස් කර අවසන් කළ යුතු බවට දැක්වුවහොත් එය නිසි පරිදි සිදු නොකර පස් දමා වැසීමක් පමණක් සිදු විය හැකි බැවින් ක්‍රමානුකූලව කාර්ය සිදු කර අවසන් කිරීම සඳහා දින 13 ක් 14 ක් ඒ සඳහා ලබා දීම සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.46)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මේ ආකාරයට මාර්ග පළුදු කිරීම හේතුවෙන් මාර්ග විශාල වශයෙන් හානි වන බවත් මාදොල වෙන්දේසි ඉඩම් වලට මේ ගැටළුව දැඩි ලෙස බලපා ඇති බවත් පවසා සිටියේය. එක් මාර්ගයක මේ ආකාරයට ජලය ලබා ගැනීම සඳහා සිදු කරන ලද පළුදු කිරීමක් වසර දෙකකට ආසන්න කාලයක් පුරාවට වසා නොමැතිව තිබෙන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 09.47)

මේ සම්බන්ධයෙන් විමසීම් කළ විට අදාල පුද්ගලයන් විසින් සභාවට මුදල් ලබා දී ඇති බවට ප්‍රකාශ කරන බවත් පැවසූ එතුමා සභාව විසින් තැන්පත් මුදල් ආපසු ගෙවීමේදී නිකුත් කරනු ලබන රිසිට්පතේ අදාල පුද්ගලයාගේ නම පමණක් සඳහන් බවත් පදිංචි ප්‍රදේශය සඳහන් නොවන බවත් පැවසීය. එම නිසා එම රිසිට්පත් වල නම සහ ලිපිනය අනිවාර්යයෙන්ම ඇතුලත් කළ යුතු බවත් තැන්පතු මුදල් නිදහස් කිරීමට පෙර කාර්මික නිලධාරියෙකු යොමු කර ස්ථාන පරීක්ෂාවක් සිදු කර නිර්දේශ ලබා ගැනීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී. එසේම ජල නළ එලූ පසු මාර්ගය යථා තත්වයට පත් කිරීම සඳහා ලබා දී ඇති දින 07 ක කාලය දීර්ඝ නොකරන ලෙසත් එසේ සිදු කළහොත් එම කාර්ය තව තවත් ප්‍රමාද විය හැකි බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 09.50)

අඩු ආදායම්ලාභීන්ට සහන ලබා දීම සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බවත් නමුත් ගෙවල් කීපයක් සඳහා මාර්ගය පළුදු කර ජලය ලබා ගන්නේ නම් එම මුදල් ගෙවීමේ හැකියාව ඇති බවත් පැවසූ එතුමා මාර්ග වලට මෙම විනාශය සිදු කරන්නේ ජල සම්පාදන මණ්ඩලයෙන් බැවින් ඒ සම්බන්ධයෙන් සභාවේ නීති දැඩි විය යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳුශ්‍යාමින්ද මැතිතුමා:**

ජල සම්පාදන මණ්ඩලයෙන් සහ ප්‍රජා ජල ව්‍යාපෘති මඟින් සිදු කරනු ලබන මාර්ග පළුදු කිරීම් හේතුවෙන් මේ යෝජනාය මහා සභාවට ඉදිරිපත් කිරීමට තමන් අදහස් කළ බව පැවසීය. පසු ගිය කාල සීමාවේදී ඒ ආකාරයේ නොසැලකිලිමත් සිදුවීම් කීපයක් සිදු වූ බවත් ඒ සම්බන්ධයෙන් වන්නා වූ නීති සම්පාදනය සඳහා මහා සභාවේ අනුමැතිය අවශ්‍ය වන බවත් පෙන්වා දෙන ලදී. මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන මැතිතුමා සඳහන් කළ ආකාරය තැන්පතු මුදල් අය කිරීමේ ගාස්තු සංශෝධනයක් මේ සමඟ සිදු කළ නොහැකි බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන කස්තිරගේ මැතිතුමා:**

අද දින න්‍යාය පත්‍රයේ ඇතුලත් මාසික වියදම් විස්තරයේ 161 වෙනි කරුණ යටතේ රු. 10,500.00 ක මුදලක් තැන්පතු මුදල් වශයෙන් ලබා ගෙන ඇති බව පෙන්වා දුන්නේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2021.09.14 දින ඉදිරිපත් කරන ලද යෝජනාවට අදාලව සංශෝධන යෝජනාවක් වෙනම ඉදිරිපත් කළ යුතු බවත් මෙම යෝජනාවට එය ඇතුලත් කළ නොහැකි බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මාර්ග වල ජල නල එළිමේදී ඇතැම් මාර්ග වල තාර කැඩී ගොස් කොන්ක්‍රීට් කරන ලද ස්ථාන කැඩී ගොස් තිබෙන බවත් ඒ ආකාරයෙන් අබලන් වී ඇති මාර්ග පළුදු කිරීමේදීත් කාපට් කරන ලද මාර්ග පළුදු කිරීම සඳහා අය කරනු ලබන මුදල් ඒ ආකාරයෙන්ම අය කරන බවත් එය අසාධාරණ බවත් පෙන්වා දෙන ලදී. පළුදු වී ඇති මාර්ග වෙනුවෙන් තැන්පතු මුදල් අය කිරීම සුදුසු නොවන බව පැවසූ එතුමා තාක්ෂණික වාර්තාවක් එම කාර්ය සිදු කිරීම සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම මුදල තැන්පතුවක් ලෙස රඳවා තබා ගන්නා බවත් පසුව නිදහස් කිරීමක් සිදු වන බවත් පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු පහත දේපල 2022 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමට තෙවරක් ලංසුපත් කැඳවූවද කිසිවෙකු ලංසු ඉදිරිපත් නොකිරීම මත මේ වන තෙක් වසා දමා ඇත. එබැවින් එම දේපළ වල අවම ලංසු මුදලින් 10% ක මුදලක් අඩු කර ටෙන්ඩර් කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | දේපල ස්වභාවය | අවම ලංසු මුදල (රු:) | 10% මුදල අඩු කල පසු අවම ලංසු මුදල (රු:) |
|---|---|---|---|
| 01 | තල්දූව සතිපොළ බදු එකතු කිරීම | 1,894,000.00 | 1,704,600.00 |
| 02 | දෙහිඕවිට එළු හා කුකුල් මස් කඩය | 115,700.40 | 104,130.36 |
| 04 | තල්දූව සතිපොළ පොදු වැසිකිළිය | 13,304.25 | 11,973.83 |
| 05 | මාගම්මන පොදු සුසාන භූමිය | 2385.00 | 2146.05 |
| 06 | මාගම්මන ආයුර්වේද භූමිය | 1600.00 | 1440.00 |
| 07 | තල්දූව කනත්ත භූමිය | 1530.00 | 1377.00 |
| 08 | අබ්බාසිවත්ත පොදු ළිඳ සහිත ඉඩම | 1000.00 | 900.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සතිපොළ වෙළඳ කුටි සඳහා ගිවිසුම් ගත වීමේදී මේ වන විට එක් වර්ෂයක් සඳහා අය කරන ගිවිසුම් ගාස්තුව රු:500.00 ක් වන අතර එම ගාස්තුව වසර ගණනාවකින් සංශෝධනය වී නොමැත.එබැවින් 2022.02.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික ගිවිසුම් ගාස්තුව රු: 1,000.00 ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක දීගලවත්ත ගම හරහා ජල ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.2,010,000.00, කි .ඒ අනුව මෙම කර්මාන්තය සඳහා සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුඥාත නිවේදනය අනුව වෙන් කර දුන් මුදල රු. 1,990,000.00 කි.එකී කර්මාන්තය ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.1,990,000.00 ක මුදල යටතේ ගිවිසුම් ගත වී වැඩ ආරම්භ කර 2021.12.31 වන දිනට I වන කොටස් ගෙවීමට අදාලව ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය බිල්පත ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. එසේ වුවද මෙම කර්මාන්තය සිදුකරගෙන යාමේදී අනුමත ඇස්තමේන්තු මුදලට වඩා මුදලක් වැය වීම හේතුවෙන් පහත සඳහන් අයිතමයන් සඳහා 10% රේට් මුදලේ වැඩි වීම සහා අරමුදලින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | අයිතමය | ඇස්තමේන්තු ගත රේට් මුදල ( රු.) | 10% වැඩි වීමෙන් පසු ගෙවීමට නිර්දේශ මුදල ( රු.) |
|---|---|---|---|
| 01 | බොරළු පස හා මඩ ඉවත් කිරීම.(ඇස්තමේන්තුගත රේට් මුදලින් 10% වැඩිවීම.) | 4,642.04 | 5,106.24 |
| 02 | අඩි 8 කොන්ක්‍රීට් වලලු සම්පාදනය හා බහාලීම. ( 20%Market price) | 15,000.00 | 18,000.00 |
| 03 | අඟල් 2 (PVC 600 ) බට සම්පාදනය හා එලීම ( සියළු අනිකුත් අවශ්‍ය ද්‍රව්‍ය සමඟ) | 320.00 | 352.00 |
| 04 | ලීටර් 1000 Plastishell double layer වතුර ටැංකිය සම්පාදනය හා තැන්පත් කිරීම.( Auto activationfloster valve) (Market value) | 160,000.00 | 176,000.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ නම් එය නිවැරදිව සිදු විය යුතු බවත් ප්‍රධාන අමාත්‍යාංශය කෝටි ගණනින් මුදල් උපයනු ලබන ආයතනයක් බවත් ප්‍රාදේශීය සභාවට එවැනි විශාල මුදල් ප්‍රමාණයක් උපයාගත නොහැකි බැවින් මේ සඳහා වැය වන ඉතිරි මුදල්ද ප්‍රධාන

අමාත්‍යාංශයෙන්ම ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව පවසා සිටියේය. එම නිසා වියදම් වන සත්‍ය මුදලම ලබා දෙන ලෙස හෝ නොඑසේ නම් එලෙස වැය වන මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු යැයි යෝජනා කළ එතුමා අඩු පාඩු පිරවීම සඳහා සභා අරමුදලේ මුදල් ප්‍රතිපාදන ලබා දීම සුදුසු නොවන බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙහි සඳහන් යෝජනා දෙකක් ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා විසින් පටලවාගෙන කතා කරන බව පැවසීය. මේ කර්මාන්තය සඳහා මුදල් ප්‍රතිපාදන ලැබී එම කාර්ය සිදු කළ බවත් බඩු වල මිල ගණන් වැඩි වීම මත රේට් වෙනස් වී ඒ සඳහා තවත් සංශෝධන ඇස්තමේන්තුවක් සාදා මුදල් ඉල්ලූ වීට ප්‍රධාන අමාත්‍යාංශයේ මුදල් නොමැති බව පැවසූ බවත් වැඩි වූ මුදල් ප්‍රමාණය සභා අරමුදලෙන් වියදම් කරන ලෙස උපදෙස් ලබා දුන් බවත් පෙන්වා දෙන ලදී. වැඩි වන මුදල එක් එක් කාර්ය සඳහා වෙන් වෙන් වශයෙන් යෝජනාවේ අඩංගු කර ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.59)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

තම පෞද්ගලික මතයත් මේ මුදල් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලබා ගැනීම සුදුසු බවත් එම ව්‍යාපෘතිය ප්‍රධාන අමාත්‍යාංයෙන් සිදු කළ එකක් බැවින් එසේ සිදු කිරීම සුදුසු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල් මැතිතුමා:**

රු.1,990,000.00 කට මේ ඇස්තමේන්තුව සකස් කරන්නේ රුපියල් ලක්ෂ විස්සට වඩා අඩු කර්මාන්ත කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදු කර ගත හැකි නිසා බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම ලක්ෂ විස්සේ සීමාව ලක්ෂ පනහ දක්වා සංශෝධනය කර ඇති බවත් එය සංශෝධනය වී මාස 06 කට වැඩි බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල් මැතිතුමා:**

එසේ නම් මෙය මහා ගැටළුවක් කර ගත යුතු කාර්යක් නොවන බවත් වර්තමානය වන විට පවතින ක්‍රමවේදය අනුව උද්දමන වේගය වැඩි වීමට සාපේක්ෂව දිනෙන් දින බඩු මිල ඉහළ යන තත්වයක් පවතින බවත් එම නිසා සභා අරමුදලේ ප්‍රතිපාදන ඇත්නම් මේ කාර්ය සිදු කිරීම සුදුසු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

නිල්වල මැතිතුමා සඳහන් කළ ගැටළුව හේතුවෙන් අද වන විට මේ ඇස්තමේන්තුව පමණක් නොව ඇස්තමේන්තු ගණනාවක් ක්‍රියාත්මක කර ගත නොහැකිව පවතින බව පෙන්වා දෙන ලදී.මේ හේතුවෙන් මහජනතාව අසන ප්‍රශ්න වලට පිළිතුරු ලබා දීමට නොහැකිව මහජන නියෝජිතයන් අසරණ වී වූ අවස්ථා තිබූ බව සිහිපත් කළ එතුමා හැකියාවක් ඇත්නම් මේ කාර්ය සිදු කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක තල්දූව සතිපොළ භූමිය සංවර්ධනය කිරීම අදියර 02 (සතිපොළ භූමිය වටා ආරක්ෂිත බැම්ම හා තාප්පය ඉදිකිරීම) කර්මාන්තය හා දිගලවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම යන කර්මාන්ත දෙකෙහි පහත සඳහන් ආකාරයට සංශෝධිත ඇස්තමේන්තුගත වටිනාකමින්

කොටසක් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉතිරි මුදල සභාවේ මූල්‍ය ප්‍රභවයක් යටතේ සම්පාදනය කර කර්මාන්තය නිමකරන ලෙස දන්වා ඇත. ඒ අනුව ඉහත කර්මාන්ත දෙක සඳහා ඉතිරි මුදල වන රු.979,406.72 සභා අරමුදලින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | මුළුවියදම (සංශෝධිත ඇස්තමේන්තුව අනුව ) | වැඩ වියදම (අමාත්‍යාංශ යෙන් වෙන් කර ඇති මුදල) | සභාව මඟින් දැරිය යුතු වියදම |
|---|---|---|---|---|
| 01 | තල්දූව සතිපොළ භූමිය සංවර්ධනය කිරීම අදියර -02 (සතිපොළ භූමිය වටා ආරක්ෂිත බැම්ම හා තාප්පය ඉදිකිරීම.) | 3,453,737.51 | 3,060,000.00 | 393,737.51 |
| 02 | දිගලවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | 3,496,539.23 | 2,910,870.02 | 585,669.21 |
| | **එකතුව** | | | **979,406.72** |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

දීගලවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පසු ගිය මහා සභා රැස්වීම් ගණනාවකදීම මේ සභාවේ දිගින් දිගටම කතා වූ බවත් ඒ අනුව මේ මධ්‍යස්ථානය පිහිටා ඇති ස්ථානය වෙනස් කළ යුතු බවට සාකච්ඡා වූ බවත් ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා මේ සඳහා දේවාල කන්ද වතු යායෙන් ඉඩම් කොටසක් වෙන් කිරීම සම්න්ධයෙන්ද කතා කළ බව පවසා සිටියේය. ඒ අනුව සියළුම මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා එකඟ වූ බැවින් මේ භූමියේම නැවත ව්‍යාපෘතියක් සිදු නොකර ඊට පෙර මේ මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට රැගෙන යාම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට නොහැකිදැයි විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

මෙම ව්‍යාපෘතියට එම ප්‍රදේශයේ ජනතාව විරුද්ධ වී තිබියදී බලහත්කාරයෙන් ඒ ව්‍යාපෘතිය සඳහා එකඟ බවට අත්සන් ලබා ගෙන ව්‍යාජ අත්සන් ලේඛණ යොදාගෙන එම මිනිසුන් මේ ව්‍යාපෘතිය සඳහා කැමති බවට පෙන්වා මේ ව්‍යාපෘතිය එම ස්ථානයේ ස්ථාපිත කළ බව පවසා සිටියේය. අද වන විට එම මිනිසුන් පත් වී ඇති අසරණභාවය එම ප්‍රදේශයට ගොස් පරීක්ෂා කරන ලෙස ඉල්ලා සිටියේය. පසුගිය සභා රැස්වීම් වලදී මේ ස්ථානය මේ සඳහා නුසුදුසු බවට සියළුම මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ බවත් ගරු සභාපතිතුමාත් එහිදී මේ ස්ථානය මීට වඩා වැඩි දියුණු කිරීම් සිදු නොකර ඒ සඳහා විකල්ප ස්ථානයක් සොයා ගැනීමට කටයුතු කරන බවට පවසා සිටි බව සිහිපත් කර සිටියේය. මේ ව්‍යාපෘතිය සිදු කරන්නට අවශ්‍ය නම් ඒ සඳහා සුදුසු ස්ථානයක් තෝරාගෙන එම කාර්ය සිදු කරන ලෙස ඉල්ලා සිටියේය. පසුගිය සභා වාර වල සිටි සභාපතිවරු සිදු කරන ලද වැරදි නොකරන්නට මේ පුටුවට තේරී පත් වූ ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් වගකීමෙන් ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් අදාල වතු සමාගමට හා අමාත්‍යාංශයට මෑතකදීත් ලිඛිතව ඉල්ලීමක් සිදු කළ බව පවසා සිටියේය. නමුත් රජයේ ඉඩමක් ලබා දීමේදී පරිසර වාර්තා හා අනෙකුත් වාර්තා සියල්ල ලබා ගෙන එම කාර්ය සිදු කරන බව පැවසූ එතුමා මෙවැනි කසළ අංගනයක් එවැනි ස්ථානයකට රැගෙන යාම ඉතාමත් පහසුවෙන් සිදු කළ හැකි කාර්යක් නොවන ව පෙන්වා දෙන ලදී. එම ස්ථානයේත් මේ

ආකාරයටම පාරිසරික ගැටළු එන බවට චෝදනා එල්ල විය හැකි බවත් එසේ වුවහොත් ඒ වගකීමත් නැවත සභාවටම එන බව පෙන්වා දෙන ලදී.එම නිසා මෙවැනි කාර්යන් දේශපාලනික සම්බන්ධතා හා බලය භාවිතා කර සිදු කළ නොහැකි බවත් සියල්ල නියමාකාරයෙන් නීත්‍යානුකූලව සිදු විය යුතු බවත් පෙන්වා දෙන ලදී. එම නිසා මෙහි යහපත් අයහපත් පැතිකඩ සම්බන්ධයෙන් නිලධාරී මට්ටමින් හොඳින් අධ්‍යනය කර එම කාර්යන් සිදු කළ යුතු බවත් එසේ නොමැති වුවහොත් නැවතත් වෙනත් ප්‍රදේශයක මේ ආකාරයෙන්ම ගැටළු උද්ගත විය හැකි බව පෙන්වා දෙන ලදී. එතෙක් දීගලවත්ත කසළ අංගනයේ තිබෙන දුගඳ අවම කර මැස්සන් බෝ වීම වැලැක්වීමේ වගකීම සභාවට පවතින බවත් එය නිසි කළමනාරකරණයෙන් අවට ජනතාවට හානියක් නොවන ලෙස වෙනත් ස්ථානයකට ගෙන යන තෙක් මෙය පවත්වාගෙන යාමේ වගකීම අප සතුව ඇති බවත් පවසා සිටියේය. එම නිසා නගරයෙන් එක් රැස් කර රැගෙන යන කසළ මීට පෙර ගබඩා කර තිබූ ආකාරයට එය වර්ෂා කාලයේදී තෙමුන බවත් එය ආවරණය වන ලෙස අංගනයක් සකස් කළ බවත් එය තව දිගු කර තව වහලක් සම්බන්ධ කිරීම මෙයින් අදහස් කරන බව පැවසීය. එවිට තෙතමනය ඇති කසළ වලින් වැස්සෙන් ජලය වැසි ජලය හා මිශ්‍ර වී අවට දුර්ගන්ධයක් හැමීම අවම කර ගත හැකි බව පෙන්වා දෙන ලදී. මේ සභා වාරය ආරම්භයේදී සතියට දින දෙක තුනක් මේ කසළ අංගනය සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා කවුරුන් හෝ පුද්ගලයෙකු මේ ස්ථානයට පැමිණි බවත් අද වන විට එය අවම කර ජනතාවට පීඩාව අවම වන ලෙස මැස්සන් හා දුගඳ නොඑන ලෙස එම ස්ථානය නඩත්තු කර පවත්වාගෙන යන බව පවසා සිටියේය. වෙනත් පළාත් පාලන ආයතන සීමාවන් තුළ රාත්‍රී කාලයේදී සුනඛයන් විසින් කසළ ගොඩවල් අවුස්සා අළුයම වන විට ඒවා මාර්ග වල තැනින් තැන තිබෙන බවත් එම ස්ථාන වලින් ගමන් කිරීමට පවා නොහැකි ලෙස දුර්ගන්දයක් ඇති බවත් පෙන්වා දුන් එතුමා මේ බල ප්‍රදේශයේ එවැන්නක් සිදු නොවන ලෙස මනා ලෙස නගරයේ සනීපාරක්ෂාව පවත්වාගෙන යාමට හැකියාව අද වන විට ලැබී ඇති බවත් ජේනවා දෙන ලදී. නිසි ලෙස කසළ එක් රැස් කර ඒවා නිසි පරිදි ගබඩා කර මේ ආකාරයෙන් නගර අලංකරණය පවත්වාගෙන යාමට හැකි වීම පළාත් පාලන ආයතනයක් ලෙස අප ලැබූ ජයග්‍රහනයක් බවත් පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.13)

**01 (xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පහත සඳහන් කර්මාන්තය ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා වන වියදම සභා අරමුදලින් දැරීමත් සුදුසු බව යෝජනා කරමි.

- දෙහිඕවිට පිටදෙණිය පොල්ඕවිට පාලමේ ප්‍රධාන බැම්ම ඉදි කර ඇති ආරම්භක බැම්මේ ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂණ බැම් කොටසක් ඉදි කිරීම - රු. 30, 250.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2007 වර්ෂයේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය පළාත් පාලන ආයතන නියෝජනය කරනු ලබන ජාතික සම්මේලනයකි. එම ආයතනය මඟින් පළාත් පාලන ක්ෂේත්‍රයේ සිටින මහජන නියෝජිතවරුන්ගේ සහ නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් වර්ෂය පුරාම ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂයේ සිට මෙම ආයතනය විසින් පළාත් පාලන ආයතන සඳහා වාර්ෂිකව අය කරනු ලබන ගාස්තු සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනයට අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු රු. 7,500.00 ක වාර්ෂික සාමාජික ගාස්තුව අදාල ආයතනය වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් SG-4836 දරණ බොලෙරෝ කැබ් රථය භාවිතා කිරීමට සුදුසු බැවින් මෙම සභාව විසින් අළුත් වැඩියා කර ප්‍රාදේශීය සභාවේ භාවිතය සඳහා යොදා ගැනීමට 2021.02.09 වෙනි දින පැවති මහා සභාවේ තීරණ අංක 02 (iii) යටතේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මෙම කැබ් රථය අලුත් වැඩියාව සඳහා සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ මේ වන විට ලැබී ඇති අතර ඒ අනුව පහත සඳහන් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නිර්දේශ ලබා දී ඇත.

- එන්ජිම අලුත්වැඩියා කිරීම
- ටින්කර් පේන්ට් කිරීම
- තට්ටුව අලුත්වැඩියා කිරීම
- ෂීට් කුෂන් කිරීම
- තිරිංග පද්ධතිය අලුත්වැඩියා කිරීම
- විද්‍යුත් පරිපථ පද්ධතිය අලුත්වැඩියා කිරීම
- දොරගුළු අලුත්වැඩියා කිරීම

දැනට සභාවේ දෛනික කටයුතු සඳහා පවතින වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් අක්කර බදු එකතු කිරීම්, මාර්ග පරීක්ෂා කිරීම් මෙන්ම කාරක සභා මඟින් සිදු කරනු ලබන ස්ථාන පරීක්ෂණ සඳහා යැමට සිදු වන බැවින් ඉහත නිර්දේශයන්ට අනුකූලව මෙම කැබ් රථය අලුත්වැඩියා කර එකී වියදම් සභා අරමුදලින් දැරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xiv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සබරගමුව පළාත් සභාව විසින් පළාත තුළ ඇති සියළුම පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරිත්වය ඒකාබද්ධ සැලැස්මකට අනුව සකස් කිරීම සඳහා යෝජිත ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්මට අනුව සකස් කරන ලද දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2022 – 2026 සිව් වාර්ෂික ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**කල් දී නැති යෝජනා :**

**(02) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

2020.12.08 මහා සභාවේ තීරණ අංක 01 (xxii) හි අනු අංක 34 යටතේ සභා සම්මත වූ දෙහිඕවිට පැරණි ප්‍රාදේශීය සභා මාර්ගය ( දෙහිඕවිට ජාතික පාසලට පිවිසුම) ඉන්ටර් ලොක් ගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තය ප්‍රායෝගික ගැටළු මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් එම යෝජනාව පහත පරිදි සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරමි.

බෝමළුව ග්‍රාම නිලධාරී වසමේ වෙලන්ගල්ල මාර්යේ තුන් වන පටුමග කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට සංවර්ධන කිරීම - රු. 100,000.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2021 අය වැය ප්‍රතිපාදන වලට අදාල කර්මාන්ත අවසන් කිරීමට කටයුතු කරන ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට ලිඛිතව දන්වා යැවූ බවත් දැන් එයට අදාලව යෝජනා ගෙන ආවොත් එම මුදල් ලබා දිය හැක්කේ 2022 අය වැය ප්‍රතිපාදන වලින් බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

2021 අය වැය යටතේ හිමි වූ ප්‍රතිපාදන වලින් තමන් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථාව නොලැබුණු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

යෝජනාව සඳහා මහා සභා අනුමැතිය ලබා දුන් පසු එය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල මන්ත්‍රීතුමා මූලික විය යුතු බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සභා කර්මාන්ත බැවින් ඒ සඳහා මූලික විය යුත්තේ සභාව නොවේදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාව විසින් යෝජනාව අනුමත කළ පසු අදාල සමිතියක් යොමු කර ගිවිසුම් ගත වී ඉදිරි ක්‍රියා මාර්ග සිදු කිරීම සංවර්ධන යෝජනාව ගෙන ආ මන්ත්‍රීවරයාගේ වගකීම බවත් අනෙකුත් මන්ත්‍රීවරුන්ද ඔවුන් විසින් ඉදිරිපත් කළ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ආකාරයෙන් බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මන්ත්‍රීවරයා ලබා දුන් යෝජනාවට අදාල ස්ථානයේ ස්ථාන පරීක්ෂාවක් සිදු කර ඇස්මේන්තු සකසා ඒ සඳහා වන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සභාවේ වගකීමක් මිස මන්ත්‍රීවරුන්ගේ වගකීමක් වන්නේ කෙසේදැයි විමසා සිටියේය. එය නිලධාරීන් සතු වගකීමක් බව පැවසීය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සේම තමන්ද මේ සභාව නියෝජනය කරනු ලබන නවක මන්ත්‍රීවරයෙක් බවත් නමුත් සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක වීමේදී අනුගමනය වන ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සොයා බැලීම අපගේ වගකීමක් බවත් පවසා සිටියේය. සංවර්ධන යෝජනාවක් සභාවෙන් අනුමත වූ පසු අදාල කාර්මික නිලධාරී ඒ සම්බන්ධයෙන් දැනුවත් කර ඇස්තමේන්තු සකස් කර ගැනීම සඳහා අප මූලික වී ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙන ලදී. පසුව ගමේ තිබෙන ප්‍රජා මූල සමිතියක් මඟින් ගිවිසුම් අත්සන් කර ගැනීම කළ යුතු බව පැසූ එතුමා මේවා නිලධාරීන් මඟින් සිදු විය යුතු කාරණා විය හැකි බවත් නමුත් අවශ්‍යතාවය ඇත්තේ අපට නම් අප ඒ සඳහා මූලික විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාව මඟින් ක්‍රියාත්මක කරන්නේ නම් කොන්ත්‍රාත්කරුවන් කැඳවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යායුතු බවත් බොහෝ අවස්ථාවල සිදු වන්නේ අදාල ගමේ සමිතියක් ඒ මහජන නියෝජිතයා විසින් මේ සඳහා යොමු කිරීම බව පැවසීය. ඒ අනුව එම සමිතිය සමඟ ගිවිසුම් ගත වී ඉතිරි කාර්යන් සිදු වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

තමන් විසින් ලබා දුන් සංවර්ධන යෝජනාවට අදාලව සකස් කළ ඇස්තමේන්තුව තමන්ට පෙන්වන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මන්ත්‍රීවරයෙකු ලබා දුන් යෝජනාවක් සභාවෙන් අනුමත කර කාර්මික නිලධාරියෙකුට යොමු කළ පසු ඒ සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීම මන්ත්‍රීවරයාගේ වගකීම බව පැවසීය. සංවර්ධන කාර්ය තම වසමේ ජනතාව වෙනුවෙන් සිදු කරන එකක් බැවින් එහි උනන්දුව මන්ත්‍රීවරයාට තිබිය යුතු බව පැවසීය. මන්ත්‍රීවරයෙකුට දීමනාවක් ලබා දෙන්නේ මේ සඳහා බවත් නොඑසේනම් මාසයකට වරක් පමණක් මේ සභා රැස්වීමට සහභාගී වී යාමට පමක් නොවන බවත් මන්ත්‍රීවරු අවබෝධ කර ගත යුතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා**

මෙහි සිදු වන කාර්යන් සම්බන්ධයෙන් අවබෝධයක් ඇති නිසා මෙලෙස විමසන බවත් කාර්මික නිලධාරී වාහනයේ නංවාගෙන ගොස් ඇස්තමේන්තු සකස් කරවා ගන්නා ආකාරය තමන්ටද දැන ගැනීමට ලැබී තිබෙන බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2020 දෙසැම්බර් මාසයේ ලබා දුන් යෝජනාවක් වසරකට වැඩි කාලයක් සිදු නොවන විට ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේ වගකීමක් යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයාටද පවතින බව පෙන්වා දුන්නේය. අඩු තරමින් ඒ සම්බන්ධයෙන් සභාපතිවරයා වශයෙන් තමන්ගෙගන් හෝ එකදු අවස්ථාවකවත් විමසා සිටියේදැයි විමසූ එතුමා වෙනත් මන්ත්‍රිවරු තමන් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනාවන්ට අදාල ඇස්තමේන්තු සකස් කර ගැනීම සඳහා තමන් මාර්ගයෙන් කාර්මික නිලධාරී දැනුවත් කිරීමට කටයුතු කරන බව පැවසීය.

( සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

ඇස්මේන්තුවක් අනුමත වූ පසු කාර්මික නිලධාරීට අදාල ස්ථානය පෙන්විය යුතු බවත් ඉන්පසු ඇස්තමේන්තු සකස් කිරීම සිදු කරන බවත් පැවසීය. මහජන නියෝජිතයන් වශයෙන් ජනතාවට සේවය කිරීමේ අපේක්ෂාවෙන් මේ ස්ථානයට පැමිණියේ නම් මීට වඩා නම්‍යශීලී විය යුතු බවත් ජනතාව වෙනුවෙන් වැඩ කිරීමට අවශ්‍ය නම් නිරන්තරයෙන් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට උනන්දු විය යුතු බව පවසා සිටියේය.

( සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝද පද්මසිරි මැතිතුමා:**

තමන්ද මේ ආකාරයට 2020 වර්ෂයේ ඉදිරිපත් කරන ලද යෝජනාවක් සංශෝධනය කර ගත් බවත් නමුත් මිල ගණන් වෙනස් වීම මත ඒවා ක්‍රියාත්මක කිරීමට අසීරු වූ බවත් පැවසීය. එම නිසා මේ වර්ෂයේදී එය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

05%ක් සමිතියට යනවා කියා එම සිමිතියට කොන්ත්‍රාත් ලබා දෙන්නේ ඇයිද යන්න් විමසා සිටියේය. සමිතිය සමඟ ගිවිසුම්ගත වුවත් මේ කාර්ය සිදු කරන්නේ පිටස්තර කොන්ත්‍රාත්කරුවෙකු මඟින් බව සැබෑ සත්‍ය බවත් ඔවුන් විසින් සමිතියට ලබා දෙන්නේ 05 % ක මුදලක් පමණක් බවත් පැවසීය. සමිතියේ නම සඳහන් වුවත් එහි ප්‍රතිලාභ භුක්ති විඳින්නේ කොන්ත්‍රාත්කරුවෙකු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගිවිසුමක් අත්සන් කළ පසු අදාල සමිතියට 05 % ක මුදලක් ලැබෙන පරිදි එම කර්මාන්තයේ මුදල් නිදහස් කරන බවත් චක්‍රලේඛයක් මඟින් එය ප්‍රකාශයට පත් කර ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

එවිට අදාල කර්මාන්තයේ වැඩි ප්‍රතිලාභ ලබන්නේ සමිතිය නොව කොන්ත්‍රාත්කරු බවත් මෙය පක්ෂ විපක්ෂ දෙපාර්ශවය මඟින්ම සිදු කරනු ලබන වංචාවක් බවත් මේ ක්‍රමය වෙනස් විය යුතු බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

කර්මාන්තයක් සඳහා ගිවිසුම්ගත වීමේදී ප්‍රජා මූල සමිතියක් මඟින් එම ගිවිසුම්ගත වීම සිදු විය යුතු බව දක්වා ඇති බවත් ඒ අනුව අදාල සමිතියක් සමඟ සභාව ගිවිසුමගත වන බවත් පැවසීය. ඉන්පසු ඒ කාර්ය කොන්ත්‍රාත්කරුවෙකුට පවරනවාද නැද්ද යන්න සම්බන්ධයෙන් සභාවට අදාල නොවන බවත් එය සමිතියේ අභිමතය පරිදි සිදු වන බවත් පෙන්වා දෙන ලදී. එසේම කෝසල ජයවීර මැතිතුමා ගෙන ආ සංවර්ධන යෝජනාවට අදාලව ඇස්මේන්තු සැදීම සිදු කළ යුතු ඒ වසම භාර කාර්මික නිලධාරිනිය දුරකථන මාර්ගයෙන් ඒ ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු දැන ගැනීමට ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමාට කතා කර ඇති බවත් නමුත් එහිදී එහි යම් ගැටළුසහගත තත්ව කීපයක් පවතින බැවින් එය පසුව සකස් කරමු යැයි එතුමා විසින් පවසා ඇති බවත් කාර්මික නිලධාරිනිය විසින් ප්‍රකාශ කර ඇති බව පැවසීය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.01.25 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව,2022.01.25 දින පැවති කාර්මික හි සේවා කාරක සභා වාර්තාව, 2022.01.25 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව, 2022.01.25 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 ජනවාරි මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව හා වියදම් විස්තරය සලකා බලන ලදී.

ආදායම් ප්‍රගති වාර්තාව - ජනවාරි මාසය

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

ඇමුණුම

| අනු අංකය | (I) ආදායම් විෂය | (II) අය ශිර්ෂය | හිඟ ආදායම | | | | | | ඇස්තමේන්තු ගත ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (III) 2022.01.01 දිනට ශේෂය රු. | (IV) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම රු. | (V) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (VI) මුළු එකතුව රු. | (VII) ප්‍රතිශතය % | (VIII) තව දුරටත් පවත්නා හිඟය (III) - (VI) | (IX) 2021 අයවැය ඇස්තමේන්තුව රු. | (X) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම රු. | (XI) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (XII) මුළු එකතුව රු. | (XIII) ප්‍රතිශතය % | (XIV) වර්ෂයේ ලැබීම් වලින් හිඟය රු. (IX)-(XII) |
| 01. | වරිපනම් බදු | 1.11 | 1,717,219 | - | 93,065 | 93,065 | 5% | **1,624,153** | 3,038,000 | | 717,251 | 717,251 | 24% | **2,320,749** |
| 02. | අක්කර බදු | 1.12 | 2,075,969 | - | 14,456 | 14,456 | 1% | **2,061,514** | 150,000 | | 1,178 | 1,178 | 1% | **148,822** |
| 03. | දැන්වීම් පුවරු ගාස්තු | 1.36 | - | - | | - | 0% | - | 125,000 | | - | - | 0% | **125,000** |
| 04. | වෙළඳ බලපත්‍ර ගාස්තු | 2.31 | - | - | | - | 0% | - | 260,000 | | 25,250 | 25,250 | 10% | **234,750** |
| 05.I | කර්මාන්ත බදු | 2.16.1 | - | - | | - | | - | 680,000 | | 78,500 | 78,500 | 12% | **601,500** |
| 05.II | ව්‍යාපාර බදු | 2.16.2 | - | - | | - | 0% | - | 430,000 | | 63,000 | 63,000 | 15% | **367,000** |
| 06. | පාරිසරික බලපත්‍ර ගාස්තු | 2.36 | - | - | | - | 0% | - | 120,000 | | 8,000 | 8,000 | 7% | **112,000** |
| 07. | කොම්පෝස්ට් පොහොර /අබලි ද්‍රව්‍ය විකුණුම් | 2.62.2 | - | - | | - | 0% | - | 800,000 | | 20,250 | 20,250 | 3% | **779,750** |
| 08. | ඉඩම් විකිණීම මත 1% බද්ද | 3.18 | - | - | | - | 0% | - | 150,000 | | 48,430 | 48,430 | 32% | **101,570** |
| 09. | පොදු වෙළඳ සංකීර්ණ කඩ කුලී | 3.22.2 3.22.3 | 2,074,474 | - | 142,500 | 142,500 | 7% | **1,931,974** | 1,935,000 | | 62,000 | 62,000 | 3% | **1,873,000** |
| 10. | අනෙකුත් කඩ කාමර කුලී | 3.22.1 / 5.22 | 49,388 | - | - | - | 0% | **49,388** | 169,800 | | 15,000 | 15,000 | 9% | **154,800** |
| 11. | ඉඩම් වල එළදාව බදු දීම | 3.24 | - | - | - | - | 0% | - | 7,600 | | - | - | 0% | **7,600** |
| 12. | යන්ත්‍රෝපකරණ කුලියට දීම | 3.25.1 | - | - | - | - | 0% | - | 1,500,000 | | 36,640 | 36,640 | 2% | **1,463,360** |
| 13. | නගර ශාලා/ ප්‍රජා ශාලා | 3.25.3 | - | - | - | - | 0% | - | 500,000 | | - | - | 0% | **500,000** |
| 14. | භූමිය කුලියට දීම/ වාහන නැවතුම් ගාස්තු | 3.43.2 | - | - | - | - | 0% | - | 50,000 | | 11,333 | 11,333 | 23% | **38,668** |
| 15. | සතිපොළ ආදායම් | 5.23.1 | 196,250 | - | - | - | 0% | **196,250** | 1,894,000 | | 141,840 | 141,840 | 7% | **1,752,160** |
| 16. | මස් කඩ හා මාළු කඩ කුලී | 5.23.2 | 2,806,100 | - | - | - | 0% | **2,806,100** | 6,867,000 | | 610,318 | 610,318 | 9% | **6,256,683** |
| 17. | ආදාහනාගාර ගාස්තු | 5.43.1 | - | - | - | - | 0% | - | 2,000,000 | | 200,500 | 200,500 | 10% | **1,799,500** |
| 18. | විනෝද බදු | 6.15 | - | - | - | - | 0% | - | 25,000 | | 70,000 | 70,000 | 280% | **(45,000)** |
| 19. | වෙනත් ආදායම් (මාකට් කඩ, මස් මාළු කඩ, සති පොළ දඩ) | 5.51.1 /3.51.1/5 .51.2 | 136,269 | - | 12,525 | 12,525 | 9% | **123,744** | 101,000 | | 1,200 | 1,200 | 1% | **99,800** |
| | **එකතුව** | | **9,055,669** | - | **262,546** | **262,546** | **3%** | **8,793,123** | **20,802,400** | - | **2,110,689** | **2,110,689** | **10%** | **18,691,711** |
| 20. | මුද්දර ගාස්තු | 1.63 | 22,898,259 | - | 7,072,110 | 7,072,110 | 31% | **15,826,149** | 20,000,000 | | - | - | 0% | **20,000,000** |
| 21. | උසාවි දඩ | 1.52 | 4,927,833 | - | - | - | 0% | **4,927,833** | 5,000,000 | | - | - | 0% | **5,000,000** |

ඇමුණුම:-

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## 2022 ජනවාරි මාසය සඳහා ආදායම් හා වියදම් විස්තරය

**(01)** ආදායම් විස්තරය

| අය ශීර්ෂය | ආදායම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන ආදායම් | | |
| 10 | වරිපනම් හා බදු | 1,085,880.19 | |
| 20 | කුලි | 1,040,697.50 | |
| 30 | බලපත්‍ර ගාස්තු | 33,250.00 | |
| 40 | සේවා සඳහා ගාස්තු | 332,898.08 | |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 53,625.00 | |
| 60 | වෙනත් ආදායම් | 7,188,536.72 | |
| 70 | ආදායම් ආධාර | 3,349,535.21 | |
| | පුනරාවර්ථන ආදායම් එකතුව | | 13,084,422.70 |
| 80 | ප්‍රාග්ධන ආදායම් | | 20,000.00 |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | | **13,104,422.70** |
| | වෙනත් ආදායම් | | |
| | විවිධ ණය ගැතියෝ (කර්මාන්ත) | 1,050,614.91 | |
| | ගිවිසුම් ඇප තැන්පත් | 2,000.00 | |
| | ස්ථාවර තැන්පත් නිදහස් කිරීම | - | |
| | සේවක ණය | 425,901.00 | |
| | අත්තිකාරම් | 5,875.76 | |
| | මුද්දර බදු තැන්පත් | 13,525.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | - | |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | 11,000.00 | |
| | මිශ්‍ර තැන්පත් | 93,933.00 | |
| | වෙනත් ආදායම් එකතුව | | 1,602,849.67 |
| | මුළු ආදායම් එකතුව | | **14,707,272.37** |

**(02)** වියදම් විස්තරය

| වැය ශීර්ෂය | වියදම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන වියදම් | | |
| 1 | වැටුප් හා වේතන | 3,585,526.43 | |
| 2 | ගමන් වියදම් | 3,416.00 | |
| 3 | සැපයුම් හා උපකරණ | 287,530.00 | |
| 4 | ප්‍රා.ව. අ.වැ. හා නඩත්තු | 304,190.00 | |
| 5 | ප්‍ර.සම්, ආවශ්‍යක හා වෙනත් සේවා | 169,571.22 | |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | - | |
| 7 | ආධාර මුදල්, ආයක මුදල් හා සහනාධාර | - | |
| 8 | විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ | - | |
| | පුනරාවර්තන වියදම් එකතුව | | **4,350,233.65** |
| | ප්‍රාග්ධන වියදම් | | |
| 9 | ප්‍රාග්ධන / උපකරණ වැය | 4,900.00 | |
| 10 | ණය ආපසු ගෙවීම් | - | |
| | ප්‍රාග්ධන වියදම් එකතුව | | **4,900.00** |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් එකතුව | | **4,355,133.65** |
| | වෙනත් වියදම් | | |
| | සේවක ණය | 120,000.00 | |
| | අත්තිකාරම් | 18,176.26 | |
| | මිශ්‍ර තැන්පත් | 53,527.25 | |
| | ණය හිමියෝ | 5,083,384.39 | |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | - | |
| | මුද්දර බදු තැන්පත් | - | |
| | ගෙවිය යුතු එකතු කල අගය මත බදු | - | |
| | වෙනත් වියදම් එකතුව | | 5,275,087.90 |
| | මුළු වියදම් එකතුව | | **9,630,221.55** |

**(ඖ) වෙනත් කරුණු:**

**සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා හදිසි අසනීප තත්වයක් හේතුවෙන් අද දින මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවන බවට දන්වා ඇති බැවින් එතුමා වෙනුවෙන් අසනීප නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමාගේ අසනීප නිවාඩු අනුමත විය.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

පොහොර අර්බුදය හේතුවෙන් වගා හානි සිදු වූ ගොවියන සඳහා වන්දි ලබා දෙන බවට කෘෂිකර්ම ඇමතිවරයා විසින් ප්‍රකාශ කළ බව සිහිපත් කරන ලදී. දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පවුල් 15,000 කට ආසන්න ප්‍රමාණයක් තේ වගාව සිය ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස පවත්වාගෙන යන බවත් ඔවුන්ගේ තේ අස්වැන්න 70%කින් පමණ පහත වැටී ඇති බැවින් එම ගොවියන් සඳහා වන්දි ලබා දිය යුතු බවට ආණ්ඩුට යෝජනා කිරීම මෙම සභාව මඟින් සිදු විය යුතු බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. එසේම මේ සභාවේ කොන්ත්‍රාත් කටයුතු සිදු වන ආකාරය අධ්‍යනය කරන ලෙස ප්‍රකාශ කළ බවත් එලෙස අධ්‍යනය කිරීමට අවශ්‍ය නොවන බවත් මේ වන තෙක් කොන්ත්‍රාත් සිදු කළ ආකාරය පිළිබඳව අධ්‍යනයකින් කටයුතු කළ බවත් පවසා සිටියේය. මේ සභාවේ කොන්ත්‍රාත් කටයුතු වලින් 50%කට වඩා සිදු කරනු ලබන්නේ ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය විසින් බවත් වසමට අදාල ප්‍රජා මූල සමිතියක් මඟින් ගිවිසුම්ගත වී කර්මාන්ත සිදු කරන්නේ නම් දීගලවත්ත ප්‍රදේශයේ කර්මාන්ත ගුරුගල්ලේ සමිතියක් මඟින් සිදු කරන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය.

(ගරු මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය සහ ගරු මන්ත්‍රීනී දිස්නා කුමාරි මැතිණිය සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.41)

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

මේ කාලය තුළ මේ ප්‍රදේශයේ දැඩි නියඟයක් පවතින බවත් එය ඒ ආකාරයෙන්ම හිඟුරලකන්ද ප්‍රදේශයටත් බලපා ඇති බවත් පැවසීය. මේ හේතුවෙන් සෑම දිනකම පස්වරු 2.00 න් පසුව බටංගල පාලම අසල සිට හිඟුරලකන්ද පාසල දක්වා ප්‍රදේශයේ ජලය හිඟ වීම මත ස්නානය සඳහා පැමිණෙන ජනතාව විශාල වශයෙන් දැක ගැනීමට හැකි බවත් පැවසීය. මේ ආකාරයට දුර බැහැර සිට මෙන්ම අවට ප්‍රදේශ වලින්ද පැමිණෙන ජනතාව අතර සිටින ඇතැම් තරුණ පිරිස් පස්වරු 4.00 න් පසුව බීමතින් ඒ අවට හැසිරෙන බවත් ඔවුන්ගේ නොමනා හැසිරීම් හේතුවෙන් ඒ මාර්ගය භාවිතා කරන ජනතාව විශාල අපහසුතාවයන්ට ලක් වන බවත් පෙන්වා දෙන ලදී. මෑතකදී විශ්‍රාමික හමුදා නිලධාරියෙකු සිය දියණිය උපකාරක පංතියක් සඳහා රැගෙන යන අවස්ථාවේදී ඔවුන්ටද මේ බීමත් තරුණ පිරිස් විසින් යම් බාධා සිදු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් අදාල පුද්ගලයා දෙහිඕවිට පොලිස් ස්ථානයේ පැමිණිල්ලක්ද සටහන් කර ඇති බව පැවසීය. මේ නිසා ජනතාව දිය නෑමට පැමිණෙන ස්ථාන වල බීමතින් හැසිරීම තහනම් යනුවෙන් පුවරු කීපයක් ප්‍රදර්ශනය කිරීමටත් සති අන්ත දින

වලදී හෝ පොලිස් මුර සංචාරයක් සන්ධ්‍යා කාලයේදී ම් අවට ප්‍රදේශ සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

නියඟ තත්වය හේතුවෙන් මානියම්ගම ප්‍රදේශයේත් විශාල ජල හිඟයක් ඇති බවත් ජනතාවට දෛනිකව පරිභෝජනය සඳහා ජලය ප්‍රමාණවත්ව නොමැති බවත් පැවසීය. කාලගුණ අනාවැකි වලට අනුව ලබන මාසයේත් වර්ෂාව බලාපොරොත්තු විය නොහැකි බැවින් ජල අර්බුදයට මුහුණ දීමට පෙර සූදානමක් තිබිය යුතු බව පවසා සිටියේය.මානියම්ගම හා අවට ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය නොලැබෙන ස්ථාන බොහොමයක් පවතින බවත් එම නිසා ජල බවුසරය මඟින් එම ජනතාවට ජලය ලබා දීමට ඉදිරියේදී සිදු වනු ඇති බව පැවසීය. එම නිසා තිබෙන සම්පත් ප්‍රමාණත් නොවන්නේ නම් පිටතින් බවුසර් ලබා ගෙන හෝ එම ජනතාවට ජලය බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සඳහා සූදානම් විය යුතු බව පැවසීය. තමන් සභාවේ කටයුතු විවේචනය නොකරන බවත් නමුත් ජලය බෙදාහැරීමේදී එය දේශපාලනීකරණය නොකර පොදුවේ සියළුදෙනාටම ජලය ලබා ගැනීමට හැකි වන පරිදි ජල බවුසරය යවන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා සඳහන් කරන ලද ගැටළුව සම්බන්ධයෙන් පරිසර හා පොදු පහසුකම් කාරක සභාව රැස් කර දෙහිඕවිට පොලිස් ස්ථානාධිපතිත් ඒ අවස්ථාවට සහභාගී කරවාගෙන මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර කඩිනම් ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරන බවත් අවශ්‍ය ස්ථාන වල පුවරු සවි කිරීමට පියවර ගන්නා බවත් පවසා සිටින ලදී. මේ ගැටළුව ඉහල වත්ත ප්‍රදේශයේත් තිබෙන බවට කීප අවස්ථාවකම තමන්ට දුරකථන මාර්ගයෙන් ඇතැම් පුද්ගලයන් විසින් දැනුවත් කළ බවත් එම නිසා ප්‍රදේශවාසීන්ද විශාල අපීරුතාවයකට පත් වන බැවින් ඒ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතු බව පැවසීය. එසේම ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සඳහන් කළ පරිදි ජල ගැටළුව උග්‍ර ලෙසම මේ වන විට පවතින බවත් සභාව සතු බවුසර මඟින් ජලය බෙදා හැරීම ඊයේ දිනයේ සිට ආරම්භ කළ බවත් පැවසීය. වසම් 39 න් වසම් 20 කට වඩා මෙම ජල ගැටළුව නිසා පීඩාවට පත්ව සිටින බව පැවසූ එතුමා එම නිසාම ජලය බෙදා හැරීමේදීත් යම් ගැටළුකාරී තත්වයන් උද්ගත වන බව පෙන්වා දෙන ලදී. එකම මාර්ගයේ වෙනත් ස්ථානයකට ජලය ලබා දීම සඳහා බවුසරය යන විට පෙර දිනයේ ජලය ලබා ගත් අයද නැවත වරක් ජලය ලබා නොදෙන බව පවසමින් චෝදනා කරන අවස්ථා ඇති බව පැවසූ එතුමා මේ අවස්ථාවේ ජනතාවත් එය අවබෝධ කර ගත යුතු බව පවසා සිටියේය. ජලය බෙදා හැරීමේදී ජලය අවර්ණ වන්නා සේම සභාවත් කිසිදු දේශපාලනික පක්ෂ භේදයක් සලකා ජලය බෙදා හැරීමක් සිදු නොකරන බවත් පවසා සිටියේය. පසු ගිය කාලයේ සභාවේ ටිපර් රථයද ලීටර් 2000 ගැලුම් දෙකක් සවි කර ජලය බෙදා හැරීම සඳහා කටයුතු කළ බව සිහිපත් කළ එතුමා නැවත වරක් එයද ජලය බෙදාහැරීම සඳහා හැකි වන ලෙස සකස් කරන ලෙස එම සේවකයන්ට උපදෙස් ලබා දුන් බව පවසා සිටින ලදී. එසේම මහජන නියෝජිතයන් වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාද බවුසරය මඟින් බීමට පමණක් ජලය ලබා ගන්නා ලෙසත් ජල නාස්තිය අවම වන ලෙස අරපිරිමැස්මෙන් පරිභෝජනය කරන ලෙසත් වසම් වල ජනතාවට උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

මීට පෙර සභා රැස්වීමකදී අල්ගොඩ ප්‍රදේශයේ ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කිරීමට ආරම්භ කළ ජල ව්‍යාපෘතියක් අක්‍රිය වී ඇති බවත් එය සභාවට පවරාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙසත් තමන් විසින් සභාවෙන් ඉල්ලා සිටි බව සිහිපත් කළ එතුමා පවතින නියං තත්වය තුළ ඇති වී තිබෙන ජල අර්බුදයට යම් සහනයක් මේ මඟින් ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදී. එසේම මේ සභාවේදී කතා කිරීමේ නිදහස ගැන කතා කළ යුතු බවත් පසු ගිය මහා සභා රැස්වීමේදි තමන් විසින් කතා කළ අවස්ථාවේදී තමන් දෙවරක් අදහස් ප්‍රකාශ කිරීමට නැඟී සිටි බව පවසමින් මට දිගින් දිගටම බාධා එල්ල කළ බවත් පසුව තමන් විසින් ප්‍රාදේශිය සභාවක රැස්වීම් පවත්වාගෙන යාමේ කාර්ය පටිපාටි රීති සම්බන්ධයෙන් සොයා බැලූ බවත් ඒ අනුව මන්ත්‍රීවරයෙකුට කතා කිරීමේදී මූලාසනය අමතා කතා කළ යුතු බවත් සභිකවරයෙක් කතා කරන විට එය නීත විරෝධී නොවන්නේ නම් එයට බාධා නොකළ යුතු බවටත් එහි සඳහන් වන බව පවසා සිටියේය. එසේම සභිකවරයෙක්

සභාව ඉදිරියේ ඇති කාර්යන් ගැන එක් වරකට වඩා කතා නොකළ යුතු බව ආදී ලෙස එහි කරුණු සඳහන් වන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය සහ ගරු මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.45)

**ගරු සභාපති ඒ.ජී.දම්ඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා අවසානයේ සඳහන් කළ කරුණ තුළම පෙර රැස්වීමේදී එතුමා නැඟී සිටි අවස්ථාවේ ඒ සඳහා විරුද්ධ වීමට හේතුව සඳහන් වී ඇති බව පෙන්වා දුන්නේය. ඒ අනුව අදාල කරුණ මහා සභාවේදී එතුමා විසින්ම පෙන්වා දීම පිළිබඳව ස්තුතිවන්ත වන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

එක කාරණාවක් ගැන වරකට වඩා කතා නොකළ යුතු බවට සඳහන්ව ඇති බවත් එහෙත් දික්ඇල්ල කොට්ඨාසය ගත් විට තම සහෝදර මන්ත්‍රීවරයා ඉතාමත් දක්ෂයෙකු බවත් එහිදී තමන්ට එතුමා සිදු කරන ලද එකිනෙකට වෙනස් වූ සංවර්ධන  කාර්යන් සම්බන්ධයෙන් විශාල වශයෙන් කතා කිරීමට සිදු වන බවත් පවසා සිටියේය. එම නිසා ජනාධිපතිතුමා විසින් සිදු කරන ක්‍රියා පිළිවෙත ගරු සභාපතිතුමා විසින් අනුගමනය නොකරන ලෙස ඉල්ලා සිටින බව පැවසීය. පසුගිය කාලයේ ගරු පාර්ලිමේන්තු අමාත්‍යවරයෙකු වූ සුසිල් ප්‍රේමජයන්ත මහතා පොළට ගොස් මාධ්‍ය හමුවේ අසන ලද ප්‍රශ්න කීපයක් සඳහා පිළිතුරු ලබා දීම හේතුවෙන් පසු දින එතුමාගේ ඇමති ධූරය අහිමි වූ බවත් භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය අහිමි වී යාමක් සිදු වී ඇති බවත් පෙන්වා දෙන ලදී. මෙම සභාව නියෝජනය කරන ලද සභාපතිවරු අතරින් වර්තමාන සභාපතිතුමා සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරු ඉතාමත් පැහැදීමෙන් කතා කරන බවත් ඒ ගෞරවය ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ගැනීම ගරු සභාපතිතුමාගේ වගකීමක් බවත් පවසා සිටියේය. එසේම ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සඳහන් කළ ආකාරයට පොහොර නොමැති වීම මත අසරණ වී සිටින තේ ගොවියන්ටත් වී ගොවියන් සඳහා ලබා දෙනු ලබන සහන ලබා දිය යුතු බවට තමන්ද ප්‍රකාශ කරන බවත් අද වන විට සිය වගා හානි වීම මත ඔවුන් දැඩි අසරණභාවයකට පත්ව ඇති බැවින් සභාවේ මැදිහත් වීමෙන් හෝ අදාල අංශ වල අවධානය මේ සම්බන්ධයෙන් යොමු කළ යුතු බව පවසා සිටින ලදී. එසේම පසු ගිය කාලයේ වීථි පහන් අලුත්වැඩියා කටයුතු සඳහා සේවකයන් දෙදෙනෙකු පමණක් සිටි බවත් නමුත් මේ වන විට රැකියා ලක්ෂයේ වැඩසටහන මඟින් යොමු කරන ලද සේවකයන්ද ඒ සඳහා සිටියත් වීථි පහන් අලුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොවන බව පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් යොමු කරන මහජන පැමිණිලි වලට නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවත් ඒ සම්බන්ධයෙන් සොයා බලන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා මෙන්ම තමන්ද නියෝජනය කරනු ලබන දික්ඇල්ල කොට්ඨාසයේ විශාල ජල හිඟයක් ඇති වී තිබන බවත් නමුත් මේ වන විට රුවන්වැල්ල ආසන සංවිධායකතුමාගේ මූලිකත්වයෙන් තම ඉල්ලීම පරිදි අල්ගොඩ සහ තව වසම් කීපයක් සඳහා ජල ව්‍යාපෘති ලබා දී තිබෙන බව පැවසීය. කෙසේ හෝ ලබන වසර වන විට මේ පානීය ජල ගැටළුව විසඳීම සඳහා ක්‍රියා මාර්ග ගන්නා බවට තමන් විසින් ජනතාවට පොරොන්දු වී ඇති බැවින් එය සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව පවසා සිටියේය. මේ වන විට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලීටර් 1000 ජල ටැංකි ගෙනවිත් තබා තිබෙන බවත් මෙම ජල ටැංකි වලින් ජල අවශ්‍යතා තදින්ම ඇති ප්‍රදේශ සඳහා ජල ටැංකි ලබා ගෙන ඒවා එම වසම් වල එක් ස්ථානයක සවි කර සභාවේ ජල බවුසරය මගින් එයට ජලය පුරවා ජනතාවට ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරමුයැයි පවසා සිටියේය. එවිට පක්ෂ භේද සලකා හෝ වෙනත් පෞද්ගලික හිතවත්කම් මත ජලය ලබා දුන්නාය යන චෝදනාව එල්ල නොවන  බවත් ජනතාවට කොතරම් සේවයක් සභාව මඟින් සිදු කළත් සුළු අතපසුවීමක් වූ සැනින් ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම විවේචන එල්ල වන බැවින් මේ ආකාරයට ජනතාවට ලබා ගැනීමට හැකි වන ලෙස තැබීම සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේම මීට සති 02 කට පෙර තමන් විසින් වීථි ලාම්පු ඉල්ලා සිටි බවත් ගරු සභාපතිතුමා විසින් එය ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත් පවසා සිටියේය. පසු ගිය දිනක තම නිවස අසලදී

කාන්තාවකගේ ගෙලට තුවාල සිදු කර මාලය කඩා ගත් බවත් උදය කාලයේදී මේ ප්‍රදේශයේ නිවාස කඩා ඇතුළු වී බඩු සොරා ගැනීම් සිදු වන බවත් පැවසීය.මත්ද්‍රව්‍ය භාවිතා කරන තරුණ පිරිස් හේතුවෙන් මේ ආකාරයේ සොරකම් බහුල වී ඇති බව පැවසූ එතුමා මේ කරුණු සම්බන්ධයෙන් ගරු සභාපතිතුම දැනුවත් කළ පසු ගරු මන්ත්‍රී වික්‍රම් චන්දන මැතිතුමා සමඟ එකතු වී මේ වීථි පහන් සවි කිරීමට ක්‍රියා කළ බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.00)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

අද වන විට ප්‍රදේශයේ ජල ප්‍රශ්නය තවත් උග්‍ර තත්වයකට පත්ව ඇති බවත් පසු ගිය මහා සභා රැස්වීමේදීත් තමන් විසින් කහනාවිට ඇල්ලේ ජලය පානය කිරීමට සුදුසු තත්වයක නොමැති බැවින් සභාවේ කාර්ය මණ්ඩලයේ පරිභෝජනය සඳහා පිටතින් ලීටර් 19 ජල බෝතල් ලබා ගන්නේද යන්න විමසා සිටි බව සිහිපත් කළ එතුමා තමන් විසින් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ජලය ලබා නොදෙන ලෙස නොපවසන බවත් ඒ සඳහා වෙනත් විකල්පයක් අනුගමනය කළ හැකි බවත් පැවසීය. ඒ අනුව සභාව සඳහා ජල පෙරන කීපයක් රැගෙන එයට ජලය දමා කාර්ය මණ්ඩලයේ පරිභෝජනයට තැබිය හැකි බව පැවසූ එතුමා එවිට සභාව මාසිකව වැය කරනු ලබන මුදල ඉතිරි කර ගත හැකි බව පවසා සිටියේය. එසේම ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් සිදු කරන ලද කුරුපැත්ත ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජලය ලලාන් වැව්ලි සමාගමට ලබා නොදී ජනතාවට බෙදාහැරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.. පෙ:ව: 11.03)

අද වන විට රටේ සිමෙන්ති හිඟයක් ඇති බවත් පාලන මිලක් යටතේ සිමෙන්ති ලබා දෙන බව පැවසුවත් තල්දුවේ සිමෙන්ති කොට්ටයක් රු.2000.00 ක මිලකට විකිණෙන බව පැවසීය. මෙය මාෆියාවක් බවත් ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් මේවා සොයා බලන ලෙස ඉල්ලා සිටියේය.රජය බලයට පත් වන විට එක නීතියක් එකම රටක් ලෙස පවසා ජනතාවගේ ඡන්දය ලබා ගත්තත් සිමෙන්ති කොට්ටයක් එක් මිලකට විකුණා ගැනීමට රජය මේ වන විට අපොහොසත් වී ඇති බව පවසා සිටින ලදී. ගරු උප සභාපතිතුමා සතොසෙ බඩු තිබෙන බවට සභාවේදී ප්‍රකාශ කළත් අද මහා සභා රැස්වීමට පැමිණෙන විට තමන් සතොසට ගොස් පරීක්ෂ කර පැමිණි බවත් පවසන ආකාරයෙන් බඩු එහි නොමැති බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී, ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.05)

මේ වන විට රට තුළ ඇති වී තිබෙන උද්දමනය හමුවේ මාර්ග සංවර්ධන කටයුතු සිදු කිරීම ප්‍රමාණවත් නොවන බවත් ජනතාවගේ කුසගිනි නිවා ඔවුන්ට සහන ලැබෙන යම් වැඩපිළිවෙලක් රජය විසින් සකස් කළ යුතු බවත් පවසා සිටියේය. අද විට මන්ත්‍රී වැටුපට අමතරව බොහෝ මන්ත්‍රීවරු කොන්ත්‍රාත් මඟින්ද ආදායම් උපයන නිසා ඔවුන්ට ජනතාවගේ අසරණ බව ඇතැම්විට අවබෝධ නොවන බව පැවසූ එතුමා තව දුරටත් සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පානීය ජල බෝතල් මිලදී ගන්නේද යන්න අද දින සභාව ඉදිරියේ ප්‍රකාශ කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

ජල ව්‍යාපෘති පිටුපස මාෆියාවක් තිබෙන බවට ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා විසින් චෝදනා කළ බවත් තමන් විසින් ක්‍රියාත්මක කළ ජල ව්‍යාපෘතිය නම් ජනතාවට සේවය ලබා දීම සඳහා සියළු කටයුතු සිදු කර නිවාස වලට ජලය ලබා දීම සඳහා බට දැමූ බවත් නමුත් ජලය නොඒම මත සොයා බැලීමේදී බට තලා දමා තිබූ බව සොයා ගත් බවත් පවසා සිටියේය.

( සභාව සෝෂාකාරී)

තමන් ඕනෑම අවස්ථාවක මෙය ක්‍රියාත්මක කිරීම සඳහා සූදානමින් සිටින බවත් පෞද්ගලික අභිමතාර්ත පසෙකලා තමන් මෙය සිදු කලේ තම ප්‍රදේශයේ ජනතාව ජල අර්බුදයෙන් විඳින පීඩාව දැක බවත් පැවසීය. එම නිසා දකින දකින සියළුම කාර්යන් විවේචනය කරනවා වෙනුවට

අවබෝධයෙන් අදහස් ප්‍රකාශ කරන්නේ නම් එය වඩාත් යෝග්‍ය බවත් සභාවේ කර්මාන්තයක් සිදු වන ක්‍රියා පිළිවෙල පිළිබඳව හෝ අවබෝධයක් නොමැතිව සිදු කරන කාර්යන් සම්බන්ධයෙන් පමණක් විවේචනය කරන මන්ත්‍රීවරු පිළිබඳව කණගාටු වන බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා සහ ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 11.14)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

සභාවේදී කතා කරනු ලබන සභාවට අදාල ප්‍රශ්න සම්බන්ධයෙන් මීළඟ මහා සභා රැස්වීමේදී පිළිතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර සභාව දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේම ජාතික දේශපාලනය පළාත් පාලන ආයතනයේ විෂයපථයට අදාල නොවන නිසා සෑම මාසයකම ඒ සම්බන්ධයෙන් කතා කිරීම සඳහා වැය කරනු ලබන කාලය ඉතිරි කර ගැනීමට ඒ සඳහා වෙනම දිනයක් යොදා ගන්නා ලෙසත් අනවශ්‍ය ලෙස සභාවේ කාලය එවැනි කාර්යන් වෙනුවෙන් නාස්ති නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී. තිඹිරාපොල අල්ගොඩ මාර්ගය විධායක ඉංජිනේරු කාර්යාලයට පවරාගෙන ඇති බවත් වසර ගණනාවකින් එහි එළිපෙහෙළි කිරීමට කටයුතු කර නොමැති බවත් පෙන්වා දෙන ලදී. සභාව මඟින් ප්‍රදේශයේ මහජන උපයෝගිතා සේවා කොතෙක් දුරට සාර්ථකව සිදු කරන්නේද යන්න සොයා බැලීම සභාව විසින් සිදු කළ යුත් බැවින් ඒ සඳහා ක්‍රියා මාර්ග ගත් යුතුව ඇති බවත් පෙන්වා දෙන ලදී. ප්‍රාදේශීය සභාවට අයත් නොවන විධායක ඉංජිනේරු කාර්යාලයෙන් නඩත්තු වන ඇතැම් මාර්ග නිසි පරිදි එළිපෙහෙළි නොකිරීම මත අනතුරුදායක තත්ව ඇති ස්ථාන බොහොමයක් එම මාර්ග වල පවතින බව පෙන්වා දෙන ලදී. මේ ආකාරයට නිසි නඩත්තුවක් සිදු නොකරන මාර්ග සභාවේ කම්කරු ශ්‍රමය යොදාගෙන ඒ කාර්යන් සිදු කිරීමටත් අදාල වියදම් විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ඉල්ලා ගැනීමටත් කටයුතු කළ හැකි නම් ඒ මාර්ග වල කැලෑ වැවීම නිසා ඇති වන අනතුරු අවම කර ගත හැකි වනු ඇති බව පෙන්වා දෙන ලදී. මේ වන විට මාර්ග පටු වීම සහ ඉදි කිරීම් සීමා උල්ලංඝනය කිරීමත් නිරන්තරයෙන් සිදු වන බැවින් ඒ සම්බන්ධයෙන්ද අවධානයෙන් සිටිය යුතු බව පැවසූ එතුමා විශ්‍රාම වැටුපට අමතරව කොන්ත්‍රාත් පදනම මතත් විශාල සේවක පිරිසක් සේවයට බඳවා ගෙන ඇති බැවින් ඔවුන්ගේ වැටුපට සමාන සේවයක් සභාව මඟින් ලබා ගත යුතු බව පවසා සිටියේය. ගැසට්ගත මාර්ග 318 ක් පවතින බැවින් මේ සියළුම මාර්ග සම්බන්ධයෙන් සොයා බැලීම සභාවේ වගකීම බව පවසා සිටියේය. රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ සේවයට බඳවා ගත් පිරිස් හෝ මේ සඳහා යොදවාගෙන අදාල කාර්ය සිදු කිරීමට පියවර ගත යුතු බවත් එසේම වීථි ලාම්පු සවි කිරීමේ කාර්ය සඳහා ඔවුන්ද සමඟ දැන් පෙරට වඩා වැඩි සේවක පිරිසක් සිටින බැවින් මේ කාර්යන් නිසි පරිදි සැලසුමකට අනුව සිදු කර සභාවට එහි ප්‍රගතිය ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දම්මිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

තිඹිරිපොල අල්ගොඩ මාර්ගය සම්බන්ධයෙන් පළාත් සභාව සමඟ කතා කළ බවත් ඒ සම්බන්ධයෙන් ලේඛනයක් එවන බවට ඔවුන් ප්‍රකාශ කළ බවත් පවසා සිටියේය. අයි. රෝඩ් ව්‍යාපෘතිය ව්‍යාපෘතියට එම මාර්ගය ඇතුලත්ව නොමැති නිසා සභාවට එය එළිපෙහෙළි කිරීම සඳහා අවසර ලබා දෙන බවට ප්‍රකාශ වූ බවත් කිලෝමීටරයක් දුර ශුද්ධ කිරීම සඳහා යම් මුදලක් ලබා දෙන බැවින් එය සභා ගිණුමට ගැනීමට කටයුතු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

ආණ්ඩුවට සහ සභාවට ප්‍රහාරාත්මකව ඇතැම් මන්ත්‍රීවරු විසින් අදහස් දක්වන බවත් එහි යම් සත්‍යතාවයකුත් තිබෙන බැවින් ඒ කරුණු සම්බන්ධයෙන් අප අවධානය යොමු කළ යුතු බව පවසා සිටියේය. ඇතැම් අවස්ථාවල නිලධාරීන්ගෙන් වන සේවය සම්බන්ධයෙන්ද යම් චෝදනා ඇති බවත් විශේෂයෙන් වීථි පහන් සවි කිරීම් සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම් සහගතව සිදු නොවන බවත් පෙන්වා දෙන ලදී. එසේම ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය පිළිබඳව බොහෝ කර්මාන්ත වල සඳහන් වෙන බවත් මෙලෙස සිදු වන්නේ ඇයිද යන්න ගැටළුවක් බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.27)

එසේම සභාව සතු මාර්ග පිටස්තර පුද්ගලයන් විසින් අල්ලා ගන්නා බවත් අනවසර වෙළඳුන් බොහෝ පිරිසක් මේ ප්‍රදේශය තුළ වෙළඳාම් කටයුතු සිදු කරන බැවින් ඔවුන්ගෙන් සභාවට යම් මුදලක් අය කර ගැනීමට කටයුතු කරන්නේ නම් සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේම ඇතැම් කාර්යන් වලදී අපට පෙනී පෙනී යම් අසාධාරණ සිදු වන බවත් ඒවා සම්බන්ධයෙන් කණගාටුවක් ඇති වන බවත් පවසා සිටි එතුමා ගරු සභාපතිතුමා ප්‍රදේශයේ බලවතා බැවින් සහ සභාපති ධූරයට තෝරා පත් කර ගත්තේ සියළුදෙනාට සේවය සිදු කිරීමට බැවින් මේ සියළු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

නොබියව ඇත්ත ප්‍රකාශ කිරිම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමාට ස්තුතිවන්ත වන බවත් එතුමාගේ ක්‍රියාව සියළුම මන්ත්‍රීවරුන්ට ආදර්ශයක් බවත් පවසා සිටියේය. එසේම පසුගිය මහා සභා රැස්වීමේදී නාපාවල මුස්ලිම් විද්‍යාල මාවතේ ඇති අනතුරුදායක වංගුවක් හේතුවෙන් එම පාසලට ගමන් ගන්නා ළමයින්ගේ ජීවිත වලට අනතුරුදායක තත්වයක් උද්ගත වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටි බවත් එසේම මෙම පාසල අසල විශාල වාහන තදබතයක් පවතින බැවින් සභාවේ මැදිහත්වීමෙන් පාසලට ප්‍රවේශ වන ස්ථානය අවට වාහන නවතා තැබීම තහනම් ලෙස දැක්වෙන පුවරුවක් එම ස්ථානයේ සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටි බව පැවසූ එතුමා ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් මේ වන තෙක් ලබා ගෙන නොමැති බැවින් ඒ කාර්ය කඩිනම් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එසේම පසුගිය දිනක නාපාවල ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වූ බවත් මේ කාර්ය සඳහා මූලික වී ක්‍රියා කළ සියළුදෙනාටම ස්තුතිවන්ත වන බවත් පවසා සිටියේය. එසේම නාපාවල කාපට් කරන ලද මාර්ගයේ පොඩි කොටසක් ඉතිරි වී ඇති බවත් එය සම්පූර්ණ කර දිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

අද දින සභාවේදී කොන්ත්‍රාත් සිදු කිරීම සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් ප්‍රකාශ වූ බවත් එහිදී වැඩි වශයෙන් කියවුණු ගුරුගල්ල එක්සත් ග්‍රාම සංවර්ධන සමිති එම වසමේ නිසා ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමාට එහි යම් සම්බන්ධයක් ඇතැයි තමන් මුලින් සිතුවත් මොහොතකට පෙර එතුමා කළ ප්‍රකාශයෙන් එතුමා එයට කිසිදු සම්බන්ධයක් නොමැති බව පැහැදිලිව ප්‍රකාශ කළ බව පවසා සිටියේය. වසමේ මන්ත්‍රීවරු එම ස්වෙච්ඡා සමිතිය පිළිබඳව නොදන්නේ නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බව පවසා සිටියේය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

හැටන් අවිස්සාවේල්ල මාර්ගයේ තිබෙන තැඹිලියාන බස් නැවතුම්පල කැඩී යාම හේතුවෙන් එම බස් නැවතුම පරිහරනය කරනු ලබන ජනතාව මහත් අසීරුතාවයකට පත් වන බව පෙන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් තමන් විසින් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කළ බවත් නමුත් සභාවෙන් ඒ බව නැවතත් දැන්විය හැකි නම් වඩාත් සුදුසු බැවින් ඒ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියා මර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටියේය. එසේම ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සඳහන් කළ ආකාරයට ලීටර් 1000 ට වැඩි ජල ටැංකි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින බැවින් ඒවායෙන් කීපයක් සභාවට ඉල්ලාගෙන ජලය හිඟ ප්‍රදේශ වල පොදු ස්ථාන වල තබා උදෑසනට එම ටැංකි පුරවා ජනතාවට ජලය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙමුයැයි පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.36)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මීට පෙරත් ජල ටැංකි ස්ථාපිත කරන ලද ප්‍රදේශ වල එම ටැංකි සඳහා ජලය පුරවා දුන් බවත් නමුත් භූගෝලීය වශයෙන් මෙම ප්‍රදේශයේ වසම් විශාලත්වයෙන් වැඩි නිසා ඇතැම් වසම් වල එක් කොටසකට යාමට සිදු වන්නේ වෙනත් වසමක් හරහා බැවින් ඇතැම් ස්ථාන කරා ළඟා වීමේ ප්‍රායෝගික ගැටළු ඇති බව පෙන්වා දෙන ලදී. නමුත් අදටත් ඇතැම් ස්ථාන වල සවි කරන ලද ටැංකි තිබෙන බවත් ඒවා යම් යම් ස්වේච්ඡා සමිති වලට භාර දී ඇති බවත් පැවසූ එතුමා තම වසම් වල එවැනි

ජල ටැංකි තිබේ නම් පොදු ස්ථානයක ඒවා සවි කිරීමට පියවර ගන්නා ලෙස සියළුම මන්ත්‍රීවරුන්ට දන්වා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා:**

පවතින නියඟය හේතුවෙන් දෙහිඕවිට නගරයයේ උස් ස්ථාන වල පිහිටි නිවාස වලට ජල සම්පාදන මණ්ඩලයෙන් සිදු කරන ජල සැපයුම නිසි පරිදි සිදු නොවන බවත් රාත්‍රී කාලයේදී ජලය ලැබුණද මේ වන විට එයද නිසි පරිදි සිදු නොවන බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද සොයා බැලීමේදී කර්මාන්ත පුරයේ බවුසර් සඳහා රාත්‍රී කාලයේ ජලය සපයන බැවින් නගරයේ නිවාස වලට ජල සැපයුම නිසි පරිදි සිදු නොවන බව අනාවරණය වූ බව පැවසීය. එබැවින් මේ දින වලදී ප්‍රාදේශීය සභාවේ ජල බවුසරයට පමණක් ජලය ලබා දෙන ලෙසත් වෙනත් ජල බවුසර් සඳහා ජලය ලබා නොදෙන ලෙසත් ජල සම්පාදන මණ්ඩලය වෙත ලිඛිතව දන්වා යවන ලෙසත් එහි පිටපතක් තමන් වෙතටද යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

බටංගල ප්‍රදේශයේ පසුගිය රජය මඟින් ඉදි කරන ලද ටැංකියක් තිබෙන බවත් නමුත් එයට ජලනල එලා තිබුණද ජලය නොමැති බව පෙන්වා දෙන ලදී. රුපියල් ලක්ෂයක් වැනි මුදලක් වියදම් කර එම අඩුපාඩු සකස් කළහොත් එයින් ජනතාවට යම් සහනයක් ලබා දිය හැකි බවත් පෙන්වා දෙන ලදී. එම නිසා තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් හෝ මේ කාර්ය සිදු කර ජනතාවට ජලය ලබා ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

වෙලන්ගල්ල වත්තේ අක්කර 1000 ක් පමණ ප්‍රදේශයක් එළි කර එහි කොටසක ඇකේෂියා සහ ඇල්බීසියා ගස් සිටුවීමට පටන් ගෙන ඇති බවත් ඇකේෂියා ශාඛය වගා කිරිම තහනම් කර ඇති අවස්ථාවක සිදු කරනු ලබන මේ ක්‍රියාව සම්බන්ධයෙන් සොයා බලා එය නැවැත්වීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

තල්දූව සිට කරවනැල්ල දක්වා යතුරුපැදි ධාවනය කිරීමට නොහැකි වන ලෙස අබලන් වී ඇති බවත් කාපට් කොටසක් පමණක් දමා ඇති නිසා අනතුරු සිදු වීමේ ප්‍රවණතාව වැඩි බැවින් ඒවා සකස් කිරීම සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී. පසුගිය සභා රැස්වීමෙන් පසු කාන්තා කමිටු පිහිට වූ බවත් එම කාර්ය අගය කරන අතර මාර්තු මාසයේදී පැවැත්වෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තාවන් වෙනුවෙන් කුමන හෝ වැඩසටහනක් සිදු කිරීමට කටයුතු කරන්නේ නම් අගය කරන බව පවසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පසු ගිය මහා සභා රැස්වීමේදීත් මේ සම්බන්ධයෙන් පැවසූ අවස්ථාවේ අදාල තොරතුරු ලබා දෙන ලෙස දන්වා සිටියත් එම තොරතුරු නොලැබුණු බවත් හැකි ඉක්මණින් ඒ තොරතුරු ලබා දෙන ලෙසත් දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මාදොල ප්‍රදේශයේ ඇති ප්‍රජා ජල ව්‍යාපෘතියක ඉහල කොටස මේ වන විට නාය ගොස් ඇති බැවින් එම ස්ථානයේ තිබූ නිවස ඉවත් කර ඇති බව පැවසීය. එසේ වුවත් ඉඩම් හිමි අය විසින් ඒ ප්‍රදේශයේ ගස් කැපීම තවදුරටත් සිදු කරන බව පැවසූ එතුමා නිවාස 54 ක් සඳහා ජලය ලබා ගන්නා ජල උල්පත් මේ හේතුවෙන් සිඳී යා හැකි බව පෙන්වා දෙන ලදී. එම ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා ගන්නේ දුප්පත් ජනතාව වන බැවින් මේ අවට රක්ෂිතයක් බවට පත් කර හෝ එම ජල ව්‍යාපෘතිය ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පෞද්ගලික ඉඩමක් නිසා තහනම් කිරීම් සිදු කිරීමට පෙර පරිසර හා පොදු පහසුකම් කාරක සභාව මඟින් ස්ථාන පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය කාර්යන් සිදු කළ යුතු බැවින් මේ සම්බන්ධයෙන් සභාවට යෝජනාවක් ලබා දෙන ලෙස දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

කාර්මික කමිටුවේ ස්ථාන පරීක්ෂාවකදී ඉරට් වත්ත ප්‍රදේශයේ නිවසකට එන ජල පහරක් හේතුවෙන් එම නිවස හිමිකරු ඉතාමත් අසරණ තත්වයකට පත්ව ඇති බවත් එම ස්ථානයේ බැම්මක් ඉදි කළහොත් එම නිවස ආරක්ෂා කර ගත හැකි බවත් පැවසූ එතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා:**

වෙලන්ගල්ල කනත්තේ මැනුම් කටයුතු කඩිනම් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. ගල්වල නිසා අසරණ වන ජනතාවට ජලය ලබා දෙන බව පැවසුවත් තාම එම කාර්ය සිදු වී නොමැති බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කාර්මික හා සේවා කාරක සභාව එම ස්ථානය පරීක්ෂා කර තීරණයක් ලබා දුන් බවත් එය ක්‍රියාත්මක නොවන්නේ නම් නැවත ඒ ගැන සොයා බලමුයැයි පවසා සිටින ලදී.

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බවත් මී ළඟ මහා සභා රැස්වීම 2022 මාර්තු මස 08 වෙනි දින පෙ:ව: 09.30 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වෙන බවත් නිවේදනය කරමින් එදින පෙ:ව: 11.51 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.